**පුවත්පත**
**නිවසටම ගෙන්වා ගැනීමට**
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න

# අරුණ

2023 ජුලි 5 බදාදා | හතර වැනි කාණ්ඩය | 237 කලාපය | මිල රු 60.00 | www.aruna.lk

## හම්බන්තොට අක්කර 2800ටම ඉන්නෙ හරක් 2000යි

02 පිටුවට

## ආබාධිත වැඩිහිටි අයට අස්වැසුම දිගටම

චාමර පල්ලේගෙදර

අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ වැඩසටහනට ඇතුළත් කර ඇති ආබාධිත, වැඩිහිටි සහ වකුගඩු දීමනාලාභීන්ට කිසිදු වෙනසකින් තොරව දීමනා ලබා දීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය තීරණය කර ඇත.

02 පිටුවට

# දරුවන්ගේ උසස් අධ්‍යාපනයට අර්ථසාධකයෙන් 30%ක්



නිලන්ත මදුරාවල

දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතුවලට සේවක අර්ථ සාධක අරමුදලින් සියයට තිහක් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීමට කම්කරු දෙපාර්තමේන්තුව තීරණය කර තිබේ.

02 පිටුවට



## හේමසිරි-පූජිත් නිදොස් කොට නිදහස් කිරීම නීතියට පටහැනියි -නීතිපති

05 පිටුවට

## දෙමස් බිලිඳියගේ කටේ කාසිය හිරවුණේ ලාදුරු මාරයාගෙන් බේරෙන්න ගිය ගමනේදී

ආරියපාල විදාගම - දොම්පේ, ඉසුරු අසංක - සපුගස්කන්ද, තෙවිදු දිනයන - දෙල්ගොඩ

රුපියල් පහේ කාසියක් උගුරේ සිරවීමෙන් දොම්පේ අරුගම්මන ප්‍රදේශයේ දෙමස් හැවිරිදි බිලිඳිය මියගියේ ඇයගේ නිවසේ ලාදුරු රෝගියකු සිටින බැවින් බිලිඳිය මිතුරියකගේ නිවසකට රැගෙන ගිය අවස්ථාවේ බව ඇයගේ මව දොම්පේ පොලිසියට පවසා ඇත.

02 පිටුවට

## අපිට නොකියා 'නාසා' සෙවණගල ගියා

### - භූ විද්‍යා පතල් හා සමීක්ෂණ කාර්යාංශය

සාලිය කුමාර ගුණසේකර

නාසා ආයතනයේ විද්‍යාඥයන් පිරිසක් සෙවණගල ප්‍රදේශයේ සිදුකරන පර්යේෂණ සම්බන්ධව භූ විද්‍යා පතල් හා සමීක්ෂණ කාර්යාංශය දැනුවත් කර නැතැයි එහි අධ්‍යක්ෂ ජනරාල් බර්නාඩ් ප්‍රේම් පැවසීය.

02 පිටුවට

## තාත්තා කිව්වේ නැතැයි සිවු හැවිරිදි දැරියට බාප්පා පහර දීලා

### අම්මත් උල්පන්දම් දීලා



දීපා වසන්ති එදිරිසිංහ

තමන්ට 'තාත්තේ' නොකිව්වැයි කිපී සිවු හැවිරිදි දැරියකට අමානුෂික ලෙස පහරදුන් බාප්පා සහ ඊට අනුබල දුන්නේ යැයි කියන දැරියගේ මව අත්අඩංගුවට ගත් බව මාතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශය පවසයි.

02 පිටුවට

## මිතුරියගේ පැමිණිල්ල විභාග නොකළැයි පිළියන්දල පොලිසියේදී ASP ඩෙඟා නටලා

02 පිටුවට

## පන්සල්වලට සන්නස්වලින් අලි දෙන්න එපා

### සුරකිමු ශ්‍රී ලංකා සංවිධානය ජනපතිට කියයි

නිර්මාණී තිලකසිරි

සන්නස් පත්‍ර මගින් අලි ඇතුන් විහාරස්ථාන වෙත පවරාදීම වහාම නතර කරන ලෙස සුරකිමු ශ්‍රී ලංකා සංවිධානය විසින් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියි.

02 පිටුවට

## මුහුදු පුරාවිද්‍යා නීති පණගන්වන්න කවුරුවත් නැහැ

### - මුහුදු පුරාවිද්‍යා ඒකකය

අනීෂා මානගේ

ශ්‍රී ලංකාව වටා පිහිටි මුහුදු පතුලේ ඓතිහාසික ස්ථාන ඇතුළුව මුහුදු පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම වෙනුවෙන් නීති පැවැතියද ඒවා බලාත්මක කිරීමට කිසිවකුත් යොදවා නොමැති බව මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුහුදු පුරාවිද්‍යා ඒකකය සඳහන් කරයි.

02 පිටුවට




## ස්පා ගමන ගැන බිරියට නොකියන්න ලක්ෂයක කප්පමක් අරන්

### පොලිස් වෙස් ගෙන ව්‍යාපාරිකයා බය කරලා

බිමල් ජයසිංහ - බණ්ඩාරගම

පොලිස් නිලධාරීන් යැයි කියා ගත් පුද්ගලයන් දෙදෙනෙකු දෙහිවල නැදිමාල ව්‍යාපාරිකයකුගේ නිවසට ගොස් ඔහු සම්භාහන මධ්‍යස්ථානයකට ගිය බවට පියාට සහ බිරිඳට පවසන බවට බිය වද්දා රුපියල් ලක්ෂයක මුදලක් බලහත්කාරයෙන් ලබා ගෙන ඇතැයි දෙහිවල පොලිසිය කියයි.

02 පිටුවට

## තායි රාජා ගෙනියන්න හැදුවොත් තායි රජයට නඩු දානවා



හිටපු දියවඩන නිලමේ

06 පිටුවට



01 වැනි පිටුවෙන්...

## දරුවන්ගේ උසස්...

ඒ අනුව පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධි හෝ ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අපේක්ෂා කරන දරුවන් සිටින සාමාජිකයන්ට ඒ සඳහා අයැදුම් කළ හැකි වෙයි.

මීට අදාළව 2012 අංක 2 දරන සේවක අර්ථ සාධක (සංශෝධන) පනත් කෙටුම්පතට සංශෝධන ගෙන එන බවත් එම සංශෝධන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත බවත් කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති 'අරුණ' ට ඊයේ (04 වැනිදා) පැවසීය. මෙම පහසුකම් කඩිනමින් ලබා දීමට බලාපොරොත්තු වන බවත් ඒ මහතා කීවේය.

මේ වන විට සේවක අර්ථ සාධක අරමුදලින් සියයට තිහක් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත්තේ නිවසක් ඉදිකිරීම, ඉඩමක් මිලදී ගැනීම ඇතුළු නිවාස කටයුතු සඳහා මෙන්ම වෛද්‍ය ප්‍රතිකාරද සඳහා පමණි.

පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා හැදෑරීම සඳහා වන පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේද සිසුන් පන්දහසකට පමණ වාර්ෂිකව අවස්ථාව හිමි වෙයි.

## තාත්තා කිව්වෙ නැතැයි ...

මෙසේ අත්අඩංගුවට පත්වූයේ මාලිම්බඩ ප්‍රදේශයේ දේවාලයක් පවත්වාගෙන යන පුද්ගලයකු හා ඔහුගේ අනියම් බිරිඳයි. මොවුන් ජීවත් වන නිවසේ නිතර දෙවේලේ දැරියක් විලාප දෙන බවට මාතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශයට ප්‍රදේශවාසීන්ගෙන් ලැබුණු තොරතුරක් මත මෙම සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබේ.

පොලිසිය එම නිවසට යන විටද දැරිය කාමරයේ ඇඳක හඬා වැළපෙමින් සිට ඇති බවත් පහර කෑමෙන් ඇයගේ සිරුර නිල් පැහැ වී තිබූ බවත් සඳහන්ය. ඉතා අසාධ්‍ය තත්ත්වයෙන් පසුවූ දැරිය මාතර මහ රෝහලට ඇතුළත් කර ඇත.

දැරියගේ මව කලින් විවාහයේ කාන්තාවක් වන අතර ඇයට දරුවන් සිවු දෙනෙකි. ඉන් දරුවන් තිදෙනෙක් සිය මව භාරයේ තබා මෙම කාන්තාව බාලම දියණිය රැගෙන අනියම් සැමියාගේ නිවසට පැමිණ ඇත. දේවාලයක් පවත්වාගෙන යන එම පුද්ගලයා දැරිය තමන්ට 'තාත්තේ' කියන්නේ නැතැයි කෝප වී මේ අයුරින් නිතර පහරදී ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත.

දැරියට අමානුෂිකව පහර දෙද්දී මවද ඒ ගැන තැකීමක් කොට නැතැයි ද සඳහන්ය. මාතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි ප්‍රධාන පොලිස් පරීක්ෂක වරුණි බෝගහවත්ත ඇතුළු කණ්ඩායමක් මේ පිළිබඳ වැඩිදුර විමර්ශන සිදු කරයි.

## පන්සල්වලට ...

ඇතැම් විහාරස්ථානවල මෙන්ම ධනවත් පුද්ගලයන්ගේ භාරකාරීත්වයේ සිටින අලි ඇතුන් වසරකට එක්වතාවක් පමණක් පෙරහර සඳහා සහභාගි කරගැනීමට යොදගන්නා බවත් වසරේ ඉතිරි කලසීමාව පුරාවටම එම සතුන් සංචාරක නිවාඩු නිකේතනවල සංචාරකයන් සතුටු කරවීමට යොද ගන්නා බැවින් කරඬුව වඩම්මවා යන හස්ථියා සංචාරකයන් පිටමත තබාගෙනයාම අද වන විට විශාල ඛේදවාචකයක් බව සුරකිමු ලංකා සංවිධානයේ සභාපති පාහියන්ගල ආනන්ද සාගර හිමියෝ චෝදනා කළහ.

එබැවින් හුදෙක් අලි ඇතුන් ඇති කිරීම ව්‍යාපාරයක් පමණක් වන බැවින් විහාරස්ථානභාරයේ අලි ඇතුන් සිරකර ඇති කිරීම නවතා දැමිය යුතු බව උන්වහන්සේ පෙන්වා දෙයි.

එමෙන්ම වෘත්තීය අධ්‍යාපනයක් නොමැතිකම හේතුවෙන් මුතුරාජා මෙන්ම හීලෑ නොමැති දෙසියකට ආසන්න අලි ප්‍රමාණයක් මේ වන විට හිංසනයට ලක්වී ඇති බව පැවසූ උන්වහන්සේ වැඩදුරත් සඳහන් කළේ සුළු අලි ඇතුන් ප්‍රමාණයක් ධනවත් පුද්ගලයන්ගේ රැකවරණයෙන් සුවසේ වාසය කෙරුවද බහුතරයක් ඇති කරන අලි ඇතුන් හිංසනයට ලක්වන බවයි.

තවද මෙහිදී උන්වහන්සේ මෙසේද පැවසීය.

''සතුන්ගේ ඇති වටිනාකම දන්න තායිලන්තය විශාල මුදලක් වැයකරලා මුතුරාජා ඒ රටට ගෙන්න ගන්නවා. නමුත් අපේ රටේ දවසකට විතරක් එක් අලියෙක් හරි මිය යනවා. මේ රටේ වනජීවී නිලධාරීන්ගේ වගකීම වෙලා තියෙන්නේ අලි මැරෙන්න නොදී රැකගන්න එක නෙවෙයි මැරෙන අලි වළදන එක. සංචාරකයෝ සියයට හැටක් විතර රටට එන්නේ රටේ ඉන්න අලි ඇත්තු බලන්න. ඒ විදිහට ඩොලර් ටික රටට ගේන සතා තමයි බලධාරීන්ගේ නොසැලකිල්ල හින්ද මරිලා යන්නේ. ඒ හින්ද මේ සම්බන්ධව වහාම ජනාධිපතිවරයා මැදිහත් විය යුතුයි''

## අපිට නොකියා..

එම පාෂාණ පර්යේෂණ සිද්ධිය සම්බන්ධයෙන් සිය කාර්යාංශය විසින් පරීක්ෂණයක් සිදු කරන බවද ඔහු කීවේය.

නාසා ආයතනයේ විද්‍යාඥයන් පිරිසක් අඟහරු ග්‍රහයාගේ තිබෙන පාෂාණවලට සමාන පාෂාණ තිබෙන බවට සෙවණගල ප්‍රදේශයේ පාෂාණ පරීක්ෂණය ආරම්භ කර තිබේ.

මෙම පර්යේෂණයට ලෝකයේ රටවල් රැසක භූ විද්‍යාඥයන් සහභාගි වී සිටිති.






# මිතුරියගේ පැමිණිල්ල විභාග නොකළැයි

# පිළියන්දල පොලිසියේදී ASP ඩෙඟා නටලා

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

හිතවතියක් කරන ලද පැමිණිල්ලක් විභාග නොකළැයි උරණ වූ සහකාර පොලිස් අධිකාරිවරයකු ඇසළ පොහෝ දින පිළියන්දල පොලිසියට පැමිණ එහි නිලධාරින්ට බැණ වැදී ආවේගශීලීව හැසිරීම සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකය මගින් පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව උසස් පොලිස් නිලධාරියකු පැවැසීය.

එම අවස්ථාවේදී එම කාන්තාවද සහකාර පොලිස් අධිකාරිවරයා සමග සිට ඇතැයි දැනගන්නට ඇත.

බස්නාහිර පළාත් ප්‍රජා පොලිස් කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරිවරයකු මෙලෙස පොලිස් නිලධාරියකුට සුදුසු නොවන අන්දමින් හැසිරී ඇති බව එම ආරංචි මාර්ග සඳහන් කරයි.

රෙදිපිළි අලෙවි කිරීමක ඇති වූ මුදල් ආරවුලක් සම්බන්ධයෙන් පැලැන්වත්ත පොල්හේන ප්‍රදේශයේ කාන්තාවක් විසින් ඉකුත් 3 වැනි දින සිදුකරන ලද පැමිණිල්ලකට අදාළව සහකාර පොලිස් අධිකාරිවරයා එලෙස කටයුතු කර තිබූ බව එම ආරංචි මාර්ග සඳහන් කරයි.

"තමුසෙලා ඕයි ඇහැට කනට පේන පාට කැල්ලක් ආවොත් විතරද වැඩ කරන්නේ"

"උඹලා සල්ලි අරගෙන තමයි වැඩ කරන්නේ උඹලගෙ හැටි මම දන්නවා" යැයි පවසමින් සුළු පැමිණිලි අංශයේ වැඩබලන ස්ථානාධිපති ලෙස කටයුතු කළ උප පොලිස් පරීක්ෂකවරයාට මෙන්ම අනෙකුත් නිලධාරින්ට බැණවදිමින් පොලිස් භූමිය තුළ ඒ මේ අත ඇවිදිමින් පැයකට අධික කාලයක් සහකාර පොලිස් අධිකාරිවරයා ආවේගශීලී ලෙස හැසිරී ඇති බව එම ආරංචි මාර්ග පවසයි.

එම අවස්ථාවේදී සුළු පැමිණිලි අංශය සහ අනෙකුත් අංශ වෙත විවිධ අවශ්‍යතා සඳහා මහජනයා විශාල පිරිසක් පැමිණ සිට ඇති අතර පොලිස් නිලධාරියාගේ එම හැසිරීම හේතුවෙන් රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරින් දැඩි අපහසුතාවට පත්වී ඇත.

සිවිල් ඇඳුමින් සැරසුණු සහකාර පොලිස් අධිකාරිවරයා පොලිසිය වෙත පැමිණ ඇත්තේ ප්‍රජා පොලිස් ඒකකයේ ස්ථානාධිපතිවරයාගේ නිල ජීප් රථයෙන් බවත් එය ඔහු ස්ථානාධිපතිවරයාගෙන් ඉල්ලාගෙන ඇත්තේ එම ප්‍රදේශයේ විහාරස්ථානයකට යන බව පවසා යැයිද පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි.

සහකාර පොලිස් අධිකාරිවරයාගේ හිතවතියගේ පැමිණිල්ල පොලිසියට ලැබී පැය විසිහතරක් ගතවීමටත් පෙර විභාග නොකළ බව ඔහු විසින් බස්නාහිර පළාතේ දකුණු දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට මෙන්ම ගල්කිස්ස කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාට ද දුරකථනයෙන් ඒ මොහොතේම දැනුම් දී ඇති බව එම ආරංචි මාර්ග සඳහන් කරයි.

උසස් පොලිස් නිලධාරියාගේ මේ නොමනා හැසිරීම සම්බන්ධයෙන් බුද්ධි අංශ නිලධාරීන් මෙන්ම අනෙකුත් නිලධාරීන් උසස් නිලධාරීන්ට පැමිණිලි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විශේෂ විමර්ශන ඒකකයේ විශේෂ පොලිස් කණ්ඩායමක් පිළියන්දල පොලිසිය වෙත ඊයේ (4වැනිදා) පැමිණ පරීක්ෂණ ආරම්භ කර මේ වන විට පිළියන්දල පොලිසියේ ස්ථානාධිපතිවරයා ඇතුළු පොලිස් නිලධාරීහු අටදෙනකුගෙන් පමණ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ ලබාගෙන ඇති බව උසස් පොලිස් නිලධාරියා වැඩිදුරටත් පැවසීය.

01 වැනි පිටුවෙන්...

## දෙමස් බිළිඳියගේ කටේ ...

මෙම බිළිඳිය මව සමගින් අරුගම්මන ප්‍රදේශයේ මවගේ නිවසේ ජීවත්ව ඇති අතර මවගේ නිවසේ අයකුට ලාදුරු රෝගය වැළඳීම නිසා මව විසින් බිළිඳිය දෙම්පෙ එගොඩපැලහැල ප්‍රදේශයේ සිටින මිතුරියගේ නිවසට රැගෙන ගොස් ඇත. ඒ පසුගිය ජූනි 30 වැනිදය.

පසුගිය (2 වැනිදා) ආගන්තුක මිතුරිය තම බිළිඳියට කිරිපොවමින් සිට තිබෙන අතර එම අවස්ථාවේ මිතුරියගේ තෙහැවිරිදි පුතුද එම ස්ථානයට පැමිණ කිරිපොවමින් සිටි බිළිඳිය සුරතල් කර ඇයගේ මුඛයට කාසියක් දමා තිබෙන බවත් ඒ අනුව බිළිඳිය මියගොස් තිබෙන බවත් පොලිසිය සඳහන් කරයි.

උගුරේ සිරවූ කාසිය පිටතට ගැනීමට බිළිඳියගේ මව සහ ඇයගේ මිතුරිය උත්සාහ කළත් එම උත්සහාය ව්‍යර්ථ වී පසුව වතුපිටවල රෝහලට ගෙන ගොස් තිබුණත් බිළිඳිය ඒ වනවිටත් මියගොස් තිබේ.

බිළිඳියගේ පියා මීට කලකට පෙර බිරිඳ සහ දරුවා අත්හැර යාමත් සමග මව සහ බිළිඳිය තනිව ජීවත්ව සිටින බවත් පියා නොමැති නිසා මාස දෙකක කාලයක් පුරා බිළිඳියට නමක් හෝ දැමීමට නොහැකි වී තිබෙන බවත් පොලිසිය සඳහන් කරයි.

බිළිඳියගේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකරනු ලැබුවේ වතුපිටිවල රෝහලේ අධිකරණ විශේෂඥ වෛද්‍ය රමේෂ් අලගියවන්න විසිනි. ස්වසන මාර්ගය අවහිර වීම නිසා මෙම මරණය සිදුවී ඇති බව අධිකරණ වෛද්‍ය විශේෂඥවරයා වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කර ඇතැයි දෙම්පේ පොලිසිය සඳහන් කරයි.

මේ මරණය පිළිබඳ පරීක්ෂණය දෙම්පේ හදිසි මරණ පරීක්ෂක ජගත් ශ්‍රී ලාල් විසින් පසුගියද (02 වැනිදා) දහවල් පැවැත්විණි. දෙම්පේ පොලිසියේ සැරයන් ප්‍රේමසිරිගේ (55545) මෙහෙයවීම යටතේ සාක්ෂි දෙමින් මියගිය බිළිඳියගේ මව මෙසේ කියා සිටියාය.

පසුගිය ඉරිද (02 වැනිදා) උදේ නිවසේ මාත් මගේ මාස දෙක හමාරක් වයසැති දියණියත් මගේ මිතුරිය හා ඇයගේ තුන් හැවිරිදි පුතා සිටියා. ඒ අවස්ථාවේ මගේ දියණිය හඬන ශබ්දයක් ඇසුනා. ඉතින් මා දියණිය නළවන්නට උත්සාහ කළත් ඇයගේ හැඬීම නතර වුණේ නැහැ. පසුව මා පුටුවක වාඩිවී දියණියට කිරි දෙන්නට සූදානම් වුණා. එතකොට අනිත් දරුවා එතැනට ඇවිත් මගේ දියණියගේ කටට කාසියක් දැම්මා. ඒ සමගම වහාම මාත් අර දරුවාගේ මවත් එක් වී කාසිය ගන්නට උත්සාහ කළා. නමුත් එය ගැනීමට අපි දෙන්නාට නො හැකිවුණා. ඉතින් අපි දියණිය දෙම්පේ රෝහලට රැගෙන ආවා. එහිදී දියණිය මිය ගිහින් කියලා දැන ගැනීමට ලැබුණා යැයි ඇය කීවාය.

මියගිය බිළිඳියගේ අවසන් කටයුතු පසුගියද අරුගම්මන පොදු සුසාන භූමියේදී සිදුකෙරුණේ බිළිඳියගේ දේහය නිවසට ගෙන යා නොහැකි වීම නිසාය.

## හම්බන්තොට අක්කර ...

■ සාලිය කුමාර ගුණසේකර

### පාඩු ලබන රජයේ ගොවිපොළ ලාභ කරන දෙවි නුවණ පහළ වෙලා

රාජ්‍ය අංශය යටතේ පාලනය වන, පාඩු ලබන ගොවිපොළවල් සියල්ල පුද්ගලික අංශයට ලබා දීමට රජයේ අවධානය යොමුවී ඇත.

එමෙන්ම ඉන්දියාවේ අමූල් සමාගම එක්ව දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු යොද තිබේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව අක්කර 30,000 ක ඉඩම් තිබුණද දිගින් දිගටම පාඩු ලබන බව කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර පැවසීය.

හම්බන්තොට රිදියගම ගොවිපොළට අක්කර 2800 ක් තිබුණද, ගවයන් 2000 ක් සිටියද දිනකට රුපියල් මිලියනයක් පාඩු ලබන බවද ඇමැතිවරයා පැවසුවේය.

පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රංශ රජයේ ණය ආධාර ඇතිව වාරියපොළ, මින්හෙට්ටිය, ගෝනගම ප්‍රදේශයේ ඉදි කරන ලද කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාරය විවෘත කිරීම සඳහා ඊයේ (04 වැනිදා) එහි පැවැති උත්සවයේදී ඇමැතිවරයා මේ බව කීවේය.

පශු සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත්, ප්‍රංශ තානාපති ජීන් ප්‍රැන්කොයිස් පැක්ටට් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

රජය සතුව තිබූ අඹේවෙල ගොවිපොළ පුද්ගලික අංශයට ලබාදෙන විට දිනක කිරි නිෂ්පාදනය කිරි ලීටර් 5000 ක් වූවත්, අද වනවිට පුද්ගලික අංශය විසින් දිනකට කිරි ලීටර් 30000 ක් නිෂ්පාදනය කරන බවද ඇමැතිවරයා කීවේය.

කිරි පිටි ආනයනය සඳහා වසරකට ඩොලර් මිලියන 600 කට වැඩි මුදලක් වැය කරන බවද, දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට හැකියාව තිබියදී පිටරටින් කිරි ආනයනය කිරීම සම්බන්ධයෙන් රජය මේ ආයතන ද වගකිවයුතු බව ඇමැතිවරයා පැවසීය.

දේශීය කිරි කර්මාන්තය නංවාලීමට ලබන වසර වන විටදී එළ ගවයින් 10 ත් 25 ත් අතර ගොවිපොළවල් සැකසීමට වැඩපිළිවෙළක් සකස් කරන ලෙසද ඇමැතිවරයා පැවසීය.

# කොළඹ මහාධිකරණයේ ඖෂධ නඩු භාණ්ඩ කාමරයේ අඩු කුඩු ගැන පරීක්ෂණ කරනවා

## පොලිසිය, අධිකරණයට කියයි

■ ඉෂාර රත්නකාර

කොළඹ මහාධිකරණයේ අන්තරායදායක ඖෂධ නඩු භාණ්ඩ කාමරයේ ආරක්ෂිතව රඳවා තිබූ හෙරොයින් කොපමණ ප්‍රමාණයක් සොරාගෙන ඇත්දැයි සෙවීමට පුළුල් පරීක්ෂණයක් පවත්වන බව පොලිසිය, අධිකරණයට ඊයේ (04 වැනිදා) දැනුම් දුන්නේය.

කොළඹ මහාධිකරණ නඩු භාණ්ඩ කාමරයේ තිබූ නඩු භාණ්ඩ සොරකම් කරන ලදැයි සැකපිට අත්අඩංගුවට ගත් කොළඹ මහාධිකරණයේ පිස්කල් පියන් තනතුරේ සේවය කරන සැකකරුවන් දෙදෙනෙක් අධිකරණය හමුවට ඉදිරිපත් කළ අවස්ථාවේ දී කෙසෙල්වත්ත පොලිසිය එලෙස දන්වා සිටියේය.

මෙලෙස අත්අඩංගුවට ගෙන තිබූ පන්නිපිටිය, දේවාලගම පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ රසික බණ්ඩාර වීරසිංහ සහ පන්නිපිටිය, මිහිඳු මාවත පදිංචි සම්පත් කුමාර ජයකොඩි නමැති සැකකරුවන් දෙදෙනා ලබන 18 වැනිදා තෙක් රිමාන්ඩ් භාරයේ තබන ලෙස කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය නියම කළේය.

පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි කෙසෙල්වත්ත පොලිසියේ නිලධාරින් කරුණු ඉදිරිපත් කරමින් අදාළ නඩු භාණ්ඩ කාමරයේ තිබී සොරකම් කරන ලද හෙරොයින් ප්‍රමාණයන් පිළිබඳව හා එම නඩු භාණ්ඩ කුමන නඩු අංකයන් යටතේ පවරන ලද නඩු භාණ්ඩ ද සහ නඩුභාණ්ඩවල වටිනාකම සම්බන්ධ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන බව අධිකරණයට දන්වා සිටියේය.

මෙම අපරාධයට අදාළව තවත් එක් සැකකරුවකු කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජකාරි කරන බවට අනාවරණය වී ඇතැයි දන්වා සිටි පොලිසිය එම සැකකරු විසින් නඩු භාණ්ඩවල තිබූ හෙරොයින් ලබාගෙන ඇති බවට අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරුගේ ප්‍රකාශ මත අනාවරණය වී ඇතැයි ද අධිකරණයට දන්වා සිටියේය.

එම සැකකරු අත්අඩංගුවට ගැනීමට විමර්ශන පවත්වන බව දන්වා සිටි පොලිසිය මෙම අපරාධය සිදුවූ කොළඹ මහාධිකරණ අන්තරායදායක ඖෂධ ගබඩා කර ඇති නඩු භාණ්ඩ කාමරයේ සේවය කළ තවත් කිහිප දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ගන්නා බවද අධිකරණයට දන්වා සිටියේය.

# දිනපොත

## ලේඛක ලේඛිකාවන්ට නේවාසික පුහුණු වැඩමුළුවක් වේයන්ගොඩදී

නිර්මාණාත්මක ලේඛනයේ නිරත ලේඛක ලේඛිකාවන් වෙනුවෙන් ප්‍රවීණ සාහිත්‍යධරයන් විසින් මෙහෙයවන ප්‍රායෝගික සහ න්‍යායාත්මක නේවාසික පුහුණු වැඩමුළුවක් මෙමස 08 සහ 09 දෙදින වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වේ.

මෙම පුහුණු වැඩමුළුව සංවිධානය හා මෙහෙයවීම කරනු ලබන්නේ සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සාහිත්‍ය උපදේශක සභාව විසිනි.

වැඩමුළුව සිංහල මාධ්‍යයෙන් නවකතා, කෙටිකතා, පද්‍ය ඇතුළු නිර්මාණාත්මක සාහිත්‍යකරණයේ නියුතු වයස අවුරුදු 18-55 අතර ආධුනික ලේඛක ලේඛිකාවන් වෙනුවෙනි. ලේඛනයේ මූලධර්ම මෙන්ම අත්දැකීම් හා භාෂාමය ප්‍රයෝග ගැන ද මෙහිදී ප්‍රායෝගික හා න්‍යායික දැනුමක් ලබා දීමට බලාපොරොත්තු වේ.

## නාගදීප නාහිමි උපහාර උළෙල අද

නාගදීප විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ පනස් වසරක සේවය අගයා සිදුකෙරෙන උපහාර උත්සවය අද (5 වැනිදා) පෙ.ව 9.00 ට නාගදීප විහාරස්ථානයේදී සිදුකෙරේ.

## රජයේ භාෂා පරිවර්තකයන්ට පත්වීම්

රජයේ භාෂා පරිවර්තන සේවය සඳහා පත්වීම් ලබාදීම අද දින පෙ.ව 9.30 අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධනගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිර පරිශ්‍රයේදී පැවැත්වේ.

## රාජසිංහ මැදි විදුහලේ නායකත්ව පුහුණු වැඩමුළුවක්

කුඩා බුත්ගමුව රාජසිංහ මාධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය නායක නායිකාවන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළුව අද (05 වැනිදා) පෙරවරු 8.00 සිට 12.00 දක්වා එම විද්‍යාලයීය පරිශ්‍රයේදී පැවැත්වේ.

# පාර්ලිමේන්තුව අද



පාර්ලිමේන්තුව අද (05 වැනිදා) පෙරවරු 9.30ට රැස්වේ.

විපක්ෂය ඉදිරිපත් කරන 'උසාවිවල අධිකරණ කටයුතු ප්‍රමාදය සහ එයට සම්බන්ධ කරුණු' පිළිබඳ සභාව කල් තැබීමේ විවාදය පැවැත්වීමට නියමිතය.

## ආබාධිත වැඩිහිටි අයට..

ඒ අනුව සමාජ සේවා වනිතා කටයුතු සහ සෞඛ්‍ය යන අමාත්‍යාංශවලින් අනුමත කර ලබාගෙන ඇති නාම ලේඛන කිසිදු සංශෝධනයකට භාජනය නොකර අස්වැසුම ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනයට ඇතුළත් කර තිබේ.

මේ දක්වා පන්ලක්ෂ විසිතුන්දහස් එකසිය පනස් නවදෙනකු මෙම දීමනාව ලබා ගත්තේය.

ඒ අතර වැඩිහිටි ප්‍රතිලාභීන් හාරලක්ෂ පනස්හයදහස් අටසිය හයක්, වකුගඩු ප්‍රතිලාභීන් දහනවදහස් හාරසිය අනූහයක් සහ ආබාධිත හතළිස් හයදහස් අටසිය පනස් හතක් වේ.

ඒ අනුව ඔවුන් සියලුදෙනාටම අස්වැසුම වැඩසටහන යටතේ අදළ දීමනා කප්පාදු කිරීමකින් තොරව ලබාදෙන බව එම මණ්ඩලයේ සාමාජික කේ.එච්. ජෙසී මලර් පැවසුවාය.

මෙම දීමනාලාභීන්ගේ නාමලේඛනය සියලුම ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිලධාරි කාර්යාලවල අද (05වැනිදා) සිට ප්‍රසිද්ධියට පත් කරන බවද ඇය සඳහන් කළාය.

එමෙන්ම මේ සඳහා අලුතින් අයැදුම්කර ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ වගකීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පවරා ඇති බවද ඇය සඳහන් කළාය.

## ස්පා ගමන ගැන...

ඒ සම්බන්ධයෙන් ව්‍යාපාරිකයා පෙරේද (03 වැනිදා) පැමිණිල්ලක් කර ඇතැයි පොලිස් නිලධාරියකු පැවැසීය

පැමිණිලිකාර ව්‍යාපාරිකයාගේ නිවසට පැමිණ තිබූ පොලිස් නිලධාරීන් යැයි කියා ගත් පුද්ගලයන් දෙදෙනෙකු ව්‍යාපාරිකයා හමුවී ඔහු සම්බාහන මධ්‍යස්ථානයේ දී ඇසුරු කළ කාන්තාවට සමාජ රෝග තිබෙන බවට තහවුරු වී ඇති බවට පවසා තිබේ.

ඒ හේතුවෙන් ව්‍යාපාරිකයාගේ ඩී.එන්.ඒ. පරීක්ෂණ සිදුකර එම වාර්තා එන තෙක් රිමාන්ඩ් කිරීමට සිදුවන බවත් එසේ නොකර සිටීමට නම් රුපියල් ලක්ෂයක මුදලක් ලබා දෙන ලෙස බිය වද්දා එකී මුදල් ලබාගත් බවද පැමිණිල්ලේ සඳහන් වේ.

## මුහුදු පුරාවිද්‍යා නීති...

ලංකාව වටා ඇති මුහුදු පතුලේ සුන්බුන් 109ක් මුහුදු පුරාවිද්‍යා ඒකකය සොයාගෙන ඇති අතර වසර සියයකට වඩා පැරණි ඓතිහාසික ස්ථාන 32ක්ද එයට අයත් වේ.

ඓතිහාසික බව හඳුනාගත්තද ඒවායේ නම්, අයත් වන කාලසීමාව ආදිය සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු නොමැති වීම හේතුවෙන් ඓතිහාසික ස්ථාන 22ක් පුරාවිද්‍යා ආරක්ෂිත ස්ථාන ලෙස නම් කිරීමට නොහැකි වී තිබේ.

කෙසේ වුවද මුහුදු පතුලේ ආරක්ෂිත ස්මාරක විනාශ කිරීම වැළැක්වීම වෙනුවෙන් නීතිමය පැත්තෙන් ආරක්ෂාව සැලසිය හැකි වුවද ඒ වෙනුවෙන් නිශ්චිත පිරිසක් යොදවා නොමැති බව කියයි. මුහුදු පුරාවිද්‍යා ඒකකයට හා පොලිසියට කරන දැනුම්දීම් හා වෙනත් වැටලීම් අවස්ථාහිදී තමන්ට අයත් රාජකාරියක් නොවුණද නාවික හමුද නිලධාරීන් මුහුදු පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධයෙන් සොයාබලන බව මුහුදු පුරාවිද්‍යා ඒකකය පවසයි. ගොඩබිම පිහිටි පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම වෙනුවෙන් ඒ වෙතට නිලධාරීන්ට යාහැකි වුවද මුහුදු පුරාවිද්‍යා ස්ථාන කරා ළඟාවීම කෙරෙහි ඒ වෙනුවෙන්ම පුහුණු කළ නිලධාරින්ගේ අවශ්‍යතාව පවතී.

නැව් සුන්බුන් ඉවත් කිරීම හෝ විනාශ කිරීමට නීතියෙන් අවසර නොමැති අතර යමකු එසේ කරනවා නම් බලපත්‍ර නොමැතිවීම යන කාරණාව පදනම් කරගෙන නීතිමය පියවර ගත හැකි බවද මුහුදු පුරාවිද්‍යා ඒකකය පවසයි.

# අඟහරු පාෂාණ සොයන 'නාසාවරුන්'ගේ ලංකාගමනය



## මේක අපේ භූමියේ ස්වාභාවිකවම ඇතිවුණු පාෂාණයක්

- මහාචාර්ය සුනිති කරුණාතිලක



පර්යේෂණ කණ්ඩායම

## ගිණිගල් පැලැස්සේ පාෂාණ අඟහරුගේ 'සර්පෙන්ටීන්' පාෂාණයට සමානයි

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රසන්න ලක්ෂිත ධර්මප්‍රිය



'සර්පෙන්ටීන්' පාෂාණය

ධර්මප්‍රිය කියා සිටියේ ගිනිගල් පැලැස්ස ප්‍රදේශයේ තිබෙන පාෂාණ වර්ගයට සමාන පාෂාණයක් සහ ඒවා ජීර්ණය වීමෙන් පවතින පස අඟහරු ලෝකයේ තිබෙන බව පර්යේෂකයින් අනාවරණය කරගෙන ඇති බවයි. 2000 වසරේ සිට 'නාසා' ආයතනය කරන ලද දුරස්ථ පරීක්ෂණවලින් අනාවරණය කරගෙන ඇත්තේ ගිනිගල් පැලැස්සේ පාෂාණවලට අඟහරුගේ ඇති පාෂාණ සමාන බව යැයි ද හෙතෙම කීවේය.

■ සාලිය කුමාර ගුණසේකර
■ ප්‍රගීත් ජනක - කොළොන්න

අඟහරු ග්‍රහයාගේ සිටින ජීවීන් පියාඹන පීරිසිවලින් විටින් විට පෘතුවියට පැමිණෙන බව අතීතයේ සිට අසන්නට ලැබුණද, ඒ බව මෙතෙක් නිශ්චිතව අනාවරණය වී නොමැත. කෙසේ වෙතත් අභ්‍යාවකාශ පර්යේෂණ සිදුකරන 'නාසා' වැනි ආයතන රැසක් මේ වනවිට අඟහරු ග්‍රහයා මත ජීවීන්ට සුදුසු පරිසරයක් ඇත්දැයි සොයා බැලීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර ඇත.

මේ අතර, 'නාසා' ආයතනයේ විද්‍යාඥයෝ කණ්ඩායමක් අඟහරු ග්‍රහයාට සම්බන්ධ සුවිශේෂී පර්යේෂණයක් මෙරටදී සිදු කරති. අඟහරු ග්‍රහයාගේ තිබෙන 'සර්පෙන්ටීන් (Serpentin)' නමැති පාෂාණයට සමානතාවයක් දක්වන පාෂාණ ශ්‍රී ලංකාවේ ගිනිගල්පැලැස්ස, ඉදිකොලපැලැස්ස, උස්සන්ගොඩ සහ යුධගනාව ආශ්‍රිත ප්‍රදේශවල ඇති බව පැවසෙන අතර, ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය සඳහා අදාළ විද්‍යාඥයන් පිරිස මෙරටට පැමිණ තිබේ.

එම පර්යේෂණ කණ්ඩායමේ ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ ශ්‍රී ලාංකිකයකු ද වන ඇමෙරිකාවේ ලුසියානා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සුනිති කරුණාතිලකය. ඔහු 'නාසා' ආයතනයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයකු ලෙස කටයුතු කරයි. අඟහරු ග්‍රහයාගේ විවිධ ප්‍රදේශවල විහිදී තිබෙන පස් වර්ගවල වෙනස්වීම ආදී කාරණා සම්බන්ධයෙන් සුනිති කරුණාතිලක මහතා පර්යේෂණ සිදු කරයි.


'නාසා' ආයතනයේ විද්‍යාඥයෝ පිරිස ඇතුළු දෙස් විදෙස් පර්යේෂණ කණ්ඩායම මේ දිනවල ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිනිගල්පැලැස්ස ගම්මානය ආශ්‍රිතව සිය පර්යේෂණ කටයුතු සිදු කරති. ඇමෙරිකාව, ඉන්දියාව සහ චීනය ඇතුළු රටවල් රැසක භූ විද්‍යා පර්යේෂකයෝ මෙම පර්යේෂණ කණ්ඩායමට අයත් වෙති. ඊට අමතරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාඥයෝ පිරිසක් ද මෙම පර්යේෂණ කණ්ඩායම නියෝජනය කරති.

"ලංකාවේ භූ ගෝලීය ලක්ෂණ අනුව පෙනී ගොස් තිබෙනවා අඟහරු ග්‍රහයාගේ තිබෙන පස් හා පාෂාණ වර්ගවලට සමරූපිතා තිබෙන බව. උදහරණයක් ලෙස 'සර්පෙන්ටීන් (Serpentin)' කියන පාෂාණය හඳුන්වාදිය හැකියි'' යනුවෙන් ආචාර්ය සුනිති කරුණාතිලක ඒ පිළිබඳව අදහස් දක්වමින් පැවසීය.

අඟහරු ග්‍රහයාගේ ඇති පාෂාණවලට සමාන පාෂාණ මෙරට පරිසර පද්ධතියේ තිබෙන බවට මීට පෙරද පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් අනාවරණය කර තිබුණේ ඒ සම්බන්ධයෙන් පර්යේෂණ වාර්තා කිහිපයක් එළිදක්වමිනි. මහාචාර්ය රෝහණ චන්ද්‍රජිත් හා මහාචාර්ය මෙත්තිකා විතානගේ විසින් එම පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත්කර කර ඇත. එම පර්යේෂණ පත්‍රිකා ඇසුරින් 'නාසා' ආයතනයේ විද්‍යාඥයින් නව පර්යේෂණ කටයුතු ආරම්භ කර තිබේ. භූ ගර්භ විශේෂඥයකු වන ආචාර්ය ප්‍රසන්න ලක්ෂිත ධර්මප්‍රිය ඇතුළු විශේෂඥ කණ්ඩායමක් විසින් ද මෙම පාෂාණ සම්බන්ධයෙන් පර්යේෂණ පවත්වා ඇත.

## අඟහරුගේ බැරි පර්යේෂණ ලංකාවේ කරන්න පුළුවන්

- කථිකාචාර්ය කපුගොල්ලේ ආනන්දකිත්ති හිමි




ශ්‍රී ලාංකවේන් හමුවූ පස් වර්ග

'නාසා' පර්යේෂණ කණ්ඩායම සමග සිටින එක් සාමාජිකයකු වන්නේ කැළණිය විශ්වවිද්‍යාලයේ වාග් විද්‍යා අංශයේ කථිකාචාර්ය කපුගොල්ලේ ආනන්දකිත්ති හිමියන්ය. උන්වහන්සේ වාග් විද්‍යාව සම්බන්ධයෙන් පර්යේෂණ රැසක් සිදුකර ඇති අතර, ජන සම්ප්‍රදයේ අන්තර්ගත තොරතුරු එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදු කරන්නේ පාෂාණ පර්යේෂණයට සමගාමීවය.

''අඟහරු ග්‍රහයා වෙත යවන ලද යානාවලින් ඡායාරූප ගෙන්වා ගැනීමේ හැකියාව තිබෙනවා. එම ඡායාරූප පියවි ඇසින් නිරීක්ෂණය කරනවා හා සමානයි. පින්තූර සහ මතුපිට වස්තූන් පරීක්ෂා කළ හැකි තවත් උපකරණ තිබෙනවා. ඒ ආකාරයෙන් පරීක්ෂා කර තහවුරු කරගත් පාෂාණ වර්ගයක් තමයි 'සර්පෙන්ටින්' යනුවෙන් හඳුන්වන්නේ. අඟහරු ළඟට ගිහින් කරගන්න බැරි සමහර පර්යේෂණ කටයුතු ලංකාවේ තිබෙන 'සර්පෙන්ටීන්' කියන පාෂාණය ආශ්‍රිතව සිදු කිරීමේ හැකියාව තිබෙනවා.


මෙම පාෂාණය ගිනිගල් පැලැස්ස සහ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රූපහ (නීල ගරුඬ පාෂාණය) ආදී ස්ථානවල පිහිටා තිබෙනවා'' යැයි කපුගොල්ලේ ආනන්දකිත්ති හිමියෝ සඳහන් කළහ.

මෙම පර්යේෂණයේදී අදාළ පාෂාණය මතුපිටින් පරීක්ෂා කිරීම, පසේ ස්වභාවය, ශුද්‍ර ජීවීන්ගේ හැසිරීම සහ පරිසරයේ ස්වභාවය ආදී කරුණු පරීක්ෂා කෙරේ. එම පර්යේෂණ කණ්ඩායම විසින් ගිණිගල් පැලැස්ස විහාරස්ථානය පිටුපස පිහිටා තිබෙන වනාන්තර ප්‍රදේශය ආශ්‍රිතව අධි සංවේදී උපකරණ භාවිතා කරමින් පරීක්ෂණ ආරම්භ කර ඇති අතර, නියැදි ලබා ගැනීම ද සිදු කෙරේ.

"අපි පරීක්ෂණ සඳහා සාම්පල් එකතු කරනවා. ඒවා වැඩිදුර පරීක්ෂණ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ අන්තර්ජාතික විශ්වවිද්‍යාල කිහිපයකට යොමු කරනවා. අධි තාක්ෂණික උපකරණ භාවිතා කරමින් අධෝක්ත කිරණ භාවිතයෙන් පාෂාණ අයත් වන්නේ කුමන ඛනිජ වර්ගයකටද කියන කාරණය අපි මෙම ස්ථානයේදී විශ්ලේෂණය කරනවා. අඟහරුවල 'සර්පෙන්ටීන්' ඇතිවුන ක්‍රමය හඳුනාගන්න අපිට අපේ පාෂාණවල පිහිටීම, ගිනිගල් පැලැස්ස ආදී ස්ථානවල මෙම පාෂාණයේ පිහිටීම, අනෙක් පාෂාණවලට අනුව එහි පිහිටීම සහ උෂ්ණත්ව පීඩන ආදීය හඳුනාගත යුතුයි. එම තොරතුරු අනාවරණය කර ගැනීමෙන් පසුව අපිට පුළුවන් යම් නිගමනයකට එන්න.

ජනවහරේදී 'ගිනිගල් පැලැස්ස' ලෙස නම් කිරීම භූ ගර්භ විද්‍යාවට අනුවම වෙලා තියෙනවා. මේක අපේ භූමියේ ස්භාවිකවම ඇතිවුණ දෙයක්. වෙනත් ග්‍රහ ලෝකයකින් කඩා වැටුණා කියන්න කිසිම සාධකයක් ගිනිගල් පැලැස්සේ පේන්න නැහැ'' යැයි මහාචාර්ය සුනිති කරුණාතිලක පැවසීය.

මේ අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ප්‍රසන්න ලක්ෂිත



කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# වත්කම් හංගන වෘත්තිය සමිති ව්‍යාපාරිකයන් දෙදහසක්

වත්කම් බැරකම් පනතට අනුව රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල වෘත්තිය සමිති නායකයන් ඇතුළු නිලධාරින් සිය වත්කම් බැරකම් ප්‍රකාශ, කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කළ යුතු බව දැනුම් දුන්නේ ඉකුත් වසරේය. ඒ සඳහා ලබා දී තිබූ කාලය ඉක්මයෑමට ඉතා ආසන්නව ඇතත් මේ දක්වා එකී කිසිවකුත් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී නොමැති බව කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කළ ප්‍රකාශය පදනම් කරගනිමින් ඊයේ 'අරුණ' ප්‍රධාන පුවත පළව ඇත.

රජය විසින් සම්මත කළ පනතකට අනුව අදාළ පුද්ගලයකු විසින් ප්‍රතිචාර නොදක්වා සිටීමට නම් ඒ සඳහා හේතුවිය හැකි කරුණු තුනකි. එකක් නම් මේ කියන්නා වූ පිරිස සතුව කිසිදු වත්කමක් නොවීමය. දෙවැන්න නම් තිබෙන වත්කම් ප්‍රකාශ කළහොත් ඒ සා වත්කමක් සරිකරගත්තේ කෙසේද යන්න ගැන නැගෙන පැනයේදී ඇඳිවත ගැලවීයාම ගැන බියවීමය. අනෙක් කාරණාව නම් රජයේ නියෝග පයිසෙකට ගණන් නොගන්නා අවිනවත් බවය. මෙරට වෘත්තිය සමිති නායක චරිත ගැන බැලීමේදී දෙවරක් නොසිතා එකී පළමු කරුණ බැහැර කළ හැකිය. බොහෝ දුරට හේතුවිය හැක්කේ එකී දෙවැනි කරුණත්, ඒ මත පදනම් වූ තෙවැනි කරුණත් විය යුතුය.

එය අපගේ අනුමානයක්, උපකල්පනයක් හෝ හිතළුවක් නොව, අද මෙරට වෘත්තිය සමිති නායකයන්ගෙ කෙරුවාව පිළිබඳ ප්‍රසිද්ධ රහසකි.

චමරියේ නැවතී සිට කෝච්චියේ හොරෙන් වැඩට ආ සමහරෙක්, වෘත්තිය සමිති නායකයන් වී කලක් ගතවන විට කොළඹ තැන් කිහිපයකින් ගෙවල්ද, තමන්ගේම කියා යාන වාහන කිහිපයක්ද, තමන්ගේ පවුලේ සැමට රජයේ රැකියාද පමණක් නොව තම හොර අඹුවන්ගේ සුඛ විහරණය පවා ඉහළින්ම සලසා දී ඇති බව රට්ටු පවසන්නේ ඉරිසියාවකින් කුඩුකේඩුකමකින් නොව අප්පිරියාවකිනි.

ඒ අනුව වෘත්තිය සමිති නායකයන් දෙස රටවැසියා බලන්නේ ජනතාව වෙනුවෙන් එකී අදාළ වෘත්තිය රැකගැනීමට පැමිණි ආරක්ෂක දේවතාවකු ලෙස නොව, වෘත්තිය සමිති වරප්‍රසාද ගණිකා වෘත්තියේ යොදවන, එකී වෘත්තියේ රිරි මාංශද උරා බොන පිසාචයකු ලෙසිනි. යම් වෘත්තියකට මේ සමාජයේ යම් ගෞරවයක් හිමිව තිබුණද ඒ ගෞරවය පැහැරූවකු ලෙසිනි. වෛද්‍ය වෘත්තිය සහ ගුරු වෘත්තිය එයට උදහරණ දෙකක් පමණි. රෝගියාගේ බෙල්ල මිරිකා අයිතිවාසිකම් ඉල්ලන වෛද්‍යවරුද, ශිෂ්‍යයාගේ පොත් බෑගය පයට පාගාගෙන අයිතිවාසිකම් ඉල්ලන ගුරුවරුන්ද හැදුවේ මේ සමාජය විසින් නොව, වෘත්තිය සමිති මානසිකත්වය විසිනි.

මේ රටේ වත්මන් පරිහානියට හේතු සකස්කර දුන් තිදෙනාගෙන් එක් අයෙක් වන්නේ වෘත්තිය සමිති නායකයාය. දේශපාලකයා සහ රාජ්‍ය අංශයේ පරිපාලන නිලධාරියා අනෙක් දෙදෙනාය. අද රටේ රාජ්‍ය අංශයේ වෘත්තිය සමිති යනු සහමුළින්ම අදාළ පක්ෂයේ කුක්කාය. ඒ කුක්කා බුරන්නේද නගුට වනන්නේද තම හාම්පුතා වූ පක්ෂයට අවශ්‍ය ලෙසින් මිස තමන්ගේ සේවායතනයට ඇති ලෙන්ගතුකම හෝ හැඟීම අනුව නොවේ. මෙවැනි කුක්කන්ට අනුව වැනෙන නගුටක් බවට පත්වීමට ඇති අකමැත්ත නිසා ඉකුත් සමයේදී මෙරට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවලට අහිමි වූ අගනා නායකත්වයන් රැසකි. වෘත්තිය සමිතියේ රූකඩ නූල නොරුස්සන් ආයතන ප්‍රධානියා මොන තරම් දක්ෂයෙක්, මොන තරම් අවංක අයෙක්, මොන තරම් දැක්මක් ඇති කෙනෙක් වුවද වෘත්තිය සමිති නායකයන්ට එය අදාළ නැත.

වත්කම් බැරකම් පනතට අනුව එක් අයකු හෝ ඒවා ඉදිරිපත් කර නොමැති වුවද, එසේ සිය වත්කම් බැරකම් ඉදිරිපත් කළ යුතු රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල වෘත්තිය සමිති නායකයන් දෙදහසක් පමණ සිටින බවද අදාළ පාදක පුවතේ සඳහන් වේ. 'දෙදහසක්' යනු පොඩි ගාණක් නොවේ. මේ රටේ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතන ඒ සා ප්‍රමාණයක් ඇත්තේද? ඒ අනුව මෙරට වෘත්තිය සමිතියක් නොමැති එවැනි ආයතනයක් නැත්තේ මෙන්ම එක ආයතනයක් තුළ අටවාගත් මෙවැනි වෘත්තිය සමිති කිහිපයක්ම ඇත්තේද බව පෙනෙයි. මේ සියල්ලෙන් එකී ආයතනයට සෙතක් වූයේ නම් අද මෙරට රාජ්‍ය අංශය මෙන්ම රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයාද සිටිය යුත්තේ මෙයට වඩා අතිශයින් ස්ථාවර සහ සමෘද්ධිමත් තැනකය. නමුත් ආයතනයටද වගතුවක් නැත. සෙසු සේවකයන්ටද සුගතියක් නැත. ස්ථාවරය හා සමෘද්ධිය සොයාගෙන ඇත්තේ වෘත්තිය සමිති නායකයන් පමණි.

රාජ්‍ය ආයතන සහ සමාන්තර පුද්ගලික ආයතන අතර තරගකාරීත්වයේදී රාජ්‍ය ආයතන බහුතරය පරාජිතය. පාඩු සහිතය. පුද්ගලික අංශය මේ සටනින් දිනන්නට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඒවා බොහොමයක වෘත්තිය සමිති නොමැතිවීම හෝ වෘත්තිය සමිති නමට පමණක් සීමා වී ඇති නිසාය.

අද මෙරටට බරක් වී ණය උතුරන රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතන ගත්විට ඒ සියල්ල මදි නොකියන්න වෘත්තිය සමිති ග්‍රහණයට හසුවූ ඒවාය. උදහරණයක් ලෙසින් තෙල් සංස්ථාව ගනිමු. එහි ප්‍රතිව්‍යුහගත කරණය සඳහා සැරසෙද්දී, සෙල්ලම් දැමීම නිසා පන්නා දැමූ එකී වෘත්තිය සමිති ලොක්කන් ගැන රටේ මහජනයා සුළුවෙන් හෝ කම්පා නොවුණේ මේ වෘත්තිය සමිතිකාරයන් විසින් තමන්ට කළ කිසිදු සෙතක් නැති බව රටවැසියා හොඳින්ම හැඳිනගෙන ඇති නිසාය.

එසේම මේ වෘත්තිය සමිති පිටුපස ඇති 'ඩීල්' ද සුළුපටු නැත. වෘත්තිය සමිති ක්ෂේත්‍රයේ බල පරාක්‍රමය පතුරන මෙරට එක්තරා පක්ෂයක ගිණුම් මේ සා තරව ඇත්තේ මේ ඩීල් නිසා යැයි කෙරෙන චෝදනාවට එම පක්ෂය තවම පිළිතුරු දී නැත. සිය කර්මාන්තශාලා ආදියෙහි වෘත්තිය සමිති ගැටලු මතුනොකරවනු පිණිස රටේ ප්‍රධාන ව්‍යාපාරිකයන් එම පක්ෂයට කප්පම් ගෙවන බවට ඇති චෝදනාවත්, එම පක්ෂයේ ගිණුම්වල ඉලක්කම් ගණනත් අතර සම්බන්ධයක් නැතැයි කිව හැකිද?

එවැනි 'ලෝකල් ඩීල්' පමණක් නොව, මෙම වෘත්තිය සමිති විසින් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන නැතිහංගස්ථාන කර දමන අන්දමට වැඩකර, ඒවා විකුණන තැනට පාර හදන්නේ, ඒවා මිලට ගැනීමට බලා සිටින ජාත්‍යන්තර සමාගම් සමග දැමූ ඩීල් අනුවද යන සැකය මතුවීම වැලකිය නොහැකිය. ඒඅනුව බැලූකල වෘත්තිය සමිතියක් අටවාගැනීම පරම ලාභ සහිත ව්‍යාපාරයකි. ඒත් ඉතින් වත්කම් බැරකම් පෙන්වන්නේ කෙසේද?

# ණය ප්‍රතිව්‍යුහගතකරණය ගැන ආණ්ඩුවත්, විපක්ෂයත් ජනතාව රැවැට්ටුවා



**රජය දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට යොමු වී ඇත්තේ රට වෙනුවෙන් ආර්ථිකය ශක්තිමත් කරගැනීමේ අරමුණෙන් නොව දේශපාලන වශයෙන් වාසි ලබා ගැනීමේ අරමුණෙන් බවත්, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම යන වචනය යොදා ගනිමින් රජය ණය උපරිමකරණයකට යොමුව ඇති බවත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික හා සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය වසන්ත අතුකෝරාල කියා සිටියි. දින පහක් බැංකු පද්ධතිය වසා දැමීමෙන් සමාජයට හෝ ආර්ථිකයට වාසියක් නොවූ බවත් ඒ තුළින් දිගුකාලීනව ණය බර වැඩි කරගැනීමක් පමණක් වූ බවත් මහාචාර්යවරයා පෙන්වා දෙයි. මෙම කාරණා සම්බන්ධයෙන් මහාචාර්ය වසන්ත අතුකෝරාල සමග 'අරුණ' කළ සාකච්ඡාවයි මේ.**

**දේශීය ණය ප්‍රශස්ථකරණය ගැන මේ වෙද්දි පාර්ලිමේන්තුවෙ වාද විවාද කරගන්නව. ආණ්ඩුව කියන මේ ණය ප්‍රශස්තකරණයෙන් අපේ ආර්ථිකයට මොනවගේ බලපෑමක් සිදුවීමට නියමිතද?**

මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුළින් ජනතාව අපේක්ෂා කළ ආකාරයේ කිසිදු බලපෑමක් ආර්ථිකය තුළ තාවකාලිකව සිදු වුණේ නෑ. 2023 මාර්තු 31 වෙනකොට රජයේ මුළු ණය ඩොලර් බිලියන අසූ හයකට ආසන්නයි. මේ තුළ ඩොලර් බිලියන හතළිස් හතකට ආසන්න දේශීය ණය ප්‍රමාණයක් සහ ඩොලර් බිලියන තිස් හයකට ආසන්න විදේශීය ණය ප්‍රමාණයක් තිබුණා. මේ ණය ප්‍රමාණයන් අඩු කරගැනීම සඳහා කටයුතු කළ යුතුව තිබුණත් මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුළ රජය ණය ප්‍රමාණාත්මකව අඩු කරගැනීමට රජය ක්‍රියා කරලා නෑ. මොකද මේ ණය නිතරම ප්‍රකාශ කරලා තියෙන්නේ නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විදියට. නාමික දළ දේශීය නිෂ්පාදිතය කාලයත් එක්ක වැඩිවීම රජය මගින් පුරෝකථනය කරලා ඒ වැඩි වීම නිසා ප්‍රතිශතය අඩු කර පෙන්වීමක් තමයි සිදු වෙලා තියෙන්නේ. බැංකු වහලා දලා දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනවා කිව්ව කාලය තුළ රජයේ ණය බර අඩු වීමක් වෙලා නෑ.

**කොහොමද ඔබ ණය බර අඩුවීමක් වී නැහැ කියන්නේ...**

මේ සම්බන්ධයෙන් අපි විශේෂයෙන් අධ්‍යයනය කළා. 2022 වෙද්දි රජයේ ණය ප්‍රමාණය රුපියල් බිලියන තිස්දස් තුන්සිය විසි එකකට ආසන්නයි. නාමික දළ දේශීය නිෂ්පාදිතය තිබුණේ රුපියල් බිලියන 23688 ක්. මේ ණය ප්‍රතිව්‍යුහගතකරණය සිදු වුණාට පසුව තත්ත්වයන් අධිමානය කරලා බලද්දි 2033 වන විට රටේ නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 68,762 දක්වා වැඩි වෙනවා කියලා අවබෝධ වෙනවා. මේ වැඩිවීම වෙන්නේ රටේ ආර්ථිකය ශක්තිමත් වීම නිසා නෙමෙයි. ඒ වගේම රජයේ සමස්ත ණය ප්‍රමාණය 2033 වන විට රුපියල් බිලියන 61, 199 දක්වා වර්ධනය වෙනවා. නාමික දළ දේශීය නිෂ්පාදිතය වැඩිවීම ණයවල වැඩි වීමට වඩා වැඩි නිසා ප්‍රතිශතයක් ලෙස අඩු වීමක් මවාපාන්න පුළුවන් වුණත් ඇත්තටම රටේ ණය බර අඩුවීමක් වෙලා නෑ. කල් පිරෙන ණය අවුරුදු දහයක් පහළොවක් වගේ කාලයක් ඉදිරියට තල්ලු කිරීමක් පමණයි සිදුවෙලා තියෙන්නේ. ඒ නිසා දිගින් දිගටම කෙටිකාලීන ණය ගැනීමේ අවශ්‍යතාවයක් රජයට ඇති වෙන්නේ නෑ. ප්‍රතිව්‍යුහගත කරනවා කියන කාරණාවේදී සිදුවුණේ මේ වගේ දෙයක්.

**දවස් පහක් බැංකු වහගෙන කරපු මේ ක්‍රියාවලිය ගැන බොහෝදෙනා බැලුවෙ සැකෙන්. ඔබ ආර්ථික විශේෂඥයෙක් විදිහට කොහොමද ඒක දකින්නේ..?**

දවස් පහක් බැංකු වහලා තියෙනවා කියලා කිව්වාට ඇත්තටම එක දවසයි බැංකු ටික හරියට වැහුවේ. අනික් දවස් ටික කොහොමත් බැංකු නිවාඩු දවස්. ඒ දවස් ටිකත් බැංකු වහලා තියෙනවා කියන කතාව පතුරමින් සමාජය තුළ ලොකු කැළඹීමක් ඇති කරන්න උත්සාහ කළා. ඒ අතර ජනතාව තුළත් අනියත බියක් ඇති කළා. ඊටීඑෆ්, ඊපීඑෆ් කපනවා වගේ කතා කියලා ජනතාව තුළ අහේතුකව කැළඹීමක් ඇති කළා. මේ අතර තවත් පාර්ශ්වයන් තම තමන්ගේ දේශපාලන මති මතාන්තර තහවුරු කරගන්න මේ අවස්ථාව යොදා ගත්තා. සමාජය තුළ විවිධ මතවාද පැතිරුණත් කිසිම දෙයක් නොකර ප්‍රතිව්‍යුහගත කිරීම කියන වචනය පෙන්නලා රජය ඔවුන්ගේ බලාපොරොත්තුව ඉෂ්ට කර ගත්තා. මේ අවස්ථාවේ දේශපාලනික වශයෙන් රජයට විශාල වාසියක් ලැබුණා.

**ඔබ කියන්නේ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරන මුවාවෙන් රජය ඔවුන්ගේ දේශපාලන අරමුණු සාක්ෂාත් කරගත්තා කියලද?**

ඇත්තටම මේ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන රට ගැන හිතලා එහෙමත් නැත්තම් රටට අත්වන ආර්ථික වාසි ගැන හිතලා ගත්ත තීරණයක් කියලා මට හිතෙන්නේ නෑ. රජය තමන්ගේ දේශපාලනික වාසි ගැන හිතලා මේ තීරණය ගත් බවක් තමයි පේන්න තියෙන්නේ. තව කාලයක් කිසිදු ණය ප්‍රශ්නයකට මුහුණ දෙන්නේ නැතිව පාලන කටයුතු කරගෙන යන්න පවත්නා දේශපාලන අධිකාරියට බලය තියෙනවා. ඒත් තව අවුරුදු අටකින් දහයකින් අපිට මේ සියලුම ණය ගෙවන්න වෙනවා. නමුත් ඒ සඳහා සැලසුම් හැදීමක් හෝ ආර්ථිකයට එළියක් ලබාදීමක් මේ ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් තුළින් සිදු වෙලා නැහැ. මේ ක්‍රමවේදය තුළ ණය තොගය ඒ ආකාරයෙන්ම ක්‍රමක්‍රමයෙන් වැඩි වේගන යනවා. ගෙවන කාලය සම්බන්ධයෙන් යම්කිසි සහනයක් ලැබීම පමණයි වෙලා තියෙන්නේ. එය දේශපාලන පක්ෂයක් තමන්ගේ බලය තහවුරු කර ගැනීමට ගත් උත්සාහයක් හැටියට හඳුන්වා දීමේ වරදක් නෑ.

**දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී සේවක අර්ථසාධක අරමුදලට, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට කිසිම අහිතකර බලපෑමක් වෙන්නෙ නැහැ කියලා ආණ්ඩුව සහතික වුණත් විපක්ෂ දේශපාලනඥයන් වගේ ඇතැම් ආර්ථික විශේෂඥයන් කියන්නෙ එම අරමුදල්වලට වන බලපෑම නවත්වන්න බෑ කියල...**

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට අනිවාර්යෙන්ම බලපෑමක් වෙනවා. නමුත් ඒ බලපෑමේ ස්වභාවය තීරණය වෙන්නේ අනාගත පොලී අනුපාතිකය සහ උද්ධමන අනුපාතිකය කියන කාරණා දෙක මත. සේවක අර්ථසාධක අරමුදලේ මුදල්වලට 2025 දක්වා 12% ක පොලී අනුපාතිකයක් දෙන්න රජය පොරොන්දු වෙලා තියෙනවා. 2025න් පසුව 9% ක පොලී අනුපාතිකයක් ක්‍රියාත්මක කරන්න යෝජනා ඉදිරිපත් වෙලා තියෙනවා. නමුත් වෙළඳපොළ අනුපාතිකය සහ උද්ධමන අනුපාතිකය පොලී අනුපාතිකයට වඩා වැඩි නම් සේවක අර්ථසාධක අරමුදලට පාඩුවක් වෙනවා.

මේ වෙද්දි සේවක අර්ථසාධක අරමුදල වැඩි පොලී අනුපාතිකයන් යටතේ තමයි ආයෝජනය කරලා තියෙන්නේ. ඒ පොලී අනුපාත ප්‍රමාණය 12%ක් දක්වා අඩු කළොත් ක්ෂණික පාඩුවක් වෙන්න වැඩි ඉඩක් තියෙනවා. ඒ නිසා දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට බලපෑමක් වෙන්නේ නැහැ කියලා තර්ක කරන්න බෑ. මේ මගින් යම්කිසි බලපෑමක් අනිවාර්යෙන්ම ඇතිවෙනවා.

**මේ ප්‍රතිව්‍යුහගත කිරීමෙන් කොටස් වෙළෙඳපොළට යම් බලපෑමක් වෙයිද?**

කොටස් වෙළඳපොළට කෙටි කාලයක් තුළ ලොකු බලපෑමක් වෙයි කියලා මම හිතන්නේ නෑ. මේ ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් සිදු වෙන්නේ කෙටිකාලීනව ආර්ථිකය යම් ආකාරයකට කළමනාකරණය කිරීම පමණයි. ඒ තුළ දිගුකාලීනව ආර්ථිකය නිවැරදි දිශාවකට ගමන් කිරීමක් හෝ දිගුකාලීනව රටේ ණය බර අඩු වීමක් වෙන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රතිව්‍යුහගත කිරීමෙන් කොටස් වෙළඳපොළට කෙටිකාලීනව ලොකු බලපෑමක් වෙන්නේ නෑ.

නමුත් පොලී අනුපාතිකයක් දිගින් දිගටම පහළ ගියොත් ජනතාව කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය කරන්න නැඹුරු වෙන්නත් වැඩි ඉඩක් තියෙනවා. පොලී අනුපාතිකයට වඩා කොටස් වෙළෙඳපොළ තුළින් ලැබෙන ඵලදාව වැඩි නම් මිනිස්සු නිරායාසයෙන්ම ඒ දිශාවට යොමු වෙනවා. එමගින් කොටස් වෙළෙඳපොළ තුළ යම් ධනාත්මක වර්ධනයක් ඇති වෙන්න පුළුවන්. නමුත් ඒ වර්ධනයත් කෙටි කාලීනයි.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනවා කියලා රජය මේ කරලා තියෙන්නේ ණය ගෙවීමේ වගකීම පිටුපසට විතැන් කිරීමක්. නමුත් ඒ විතැන් කිරීමට සාපේක්ෂව අපේ රටේ ආර්ථිකය වේගයෙන් ශක්තිමත් වෙන්නේ නැති නිසා අනාගතයේදී අපිට මේ අර්බුදයට වඩා දෙතුන් ගුණයකින් වැඩි වූ බරපතළ අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා.

**මෙය අපේ බැංකු පද්ධතියට ඇතිකරන තෙරපුම මොනවගේ වෙයිද?**

මේ වෙනකොට ලංකාවේ බැංකු පද්ධතිය ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කරලා තියෙනවා. ඒ වගේම විදේශීය විනිමය බැංකු ඒකක ලංකාවේ තියෙනවා. සංවර්ධන බැඳුම්කරවල මුදල් ආයෝජනය කළ බැංකුවලට මේ ප්‍රතිව්‍යුහගත කිරීම් නිසා යම් ආකාරයක හානියක් වෙන්න ඉඩකඩ තියෙනවා. මොවුන්ට රජය විසින් විකල්පයන් තුනක් ඉදිරිපත් කරලා තියෙනවා. මොන විකල්පය තෝරා ගත්තත් මේ ප්‍රතිව්‍යුහගත කිරීම නිසා ඔවුන්ට යම් අවාසියක් වෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ස්වෛරී බැඳුම්කරවල රටේ බැංකු යම් ආකාරයක මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරලා තියෙනවා. ඒ වගේම ලංකා සංවර්ධන බැඳුම්කරවලත් බොහොමයක් බැංකු තැම්පතුවලින් යම් ප්‍රතිශතයක් ආයෝජනය කරලා තියෙනවා. ස්වෛරී බැඳුම්කරවල සහ සංවර්ධන බැඳුම්කරවල ආයෝජකයින්ගේ ආයෝජන මේ ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන යටතේ නිදහස් කරලා නැහැ. ඒ නිසා ආයෝජකයින්ට ලැබෙන මුදල්වල ඵලදායිතාවය යම්කිසි ආකාරයකින් අඩුවෙනවා. මේ විදිහට දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම බැංකු පද්ධතියට යම් ආකාරයකට බලපානවා. ඒත් මේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන නිසා කෙටි කාලයක් තුළ බැංකු පද්ධතියට විශාල බලපෑමක් එල්ල වෙන්නේ නැහැ. නමුත් ආර්ථිකය ශක්තිමත් නොවීම, ආර්ථිකය තුළ නිෂ්පාදනයන් වර්ධනය නොවීම වැනි කාරණාවන් පදනම් කරගෙන බැංකු පද්ධතියට යම් ආකාරයක දිගුකාලීන බලපෑම් එල්ල වෙන්න ඉඩකඩ තියෙනවා.

■ සංවාදය - නිරෝෂා වාසල



## ගපිරීගේ කවිය

### ජනපති ඇරයුම්...

ජනපති විපක්ෂයෙ නායකතුමා හට
අමතයි ප්‍රසිද්ධියෙ නියමිත වෙලාවට
"මොකටද බොරු තර්ක? එක්විය හැකිය හෙට"
ජනතා ප්‍රශ්න විසඳන්නට 'එකම ගෙට'

රට ගොඩනැඟීමට දයක වුණා නම්
ජනපතිවරණෙටත් 'ස්කෝර්' කළා නම්
හොඳ නැද්දැ යි අසන එක නැරඹුවා නම්
බැලුවැකි ප්‍රතිචාර නුදුරු ම දිනේ නම්

# ඩියුටි ෆ්‍රී සේවිකාවගේ රහස් පෙදෙසේ කිලෝ පහක රත්තරං ජෙල්



## වටිනාකම කෝටි දහයයි

■ ටී.කේ.ජී.කපිලකටුනායක

රුපියල් කෝටි දහයකට අධික වටිනාකමක් සහිත රත්තරන් ජෙල් ද්‍රාවණයක් අඩංගු පාර්සල් 04ක්, තම සිරුරේ රහස් ප්‍රදේශයේ සඟවා ගෙන කටුනායක ගුවන් තොටුපොළෙන් පිටතට රැගෙන යමින් සිටි ගුවන් තොටුපොළ තීරු බදු රහිත සාප්පු සංකීර්ණයේ සේවිකාවක් ගුවන් තොටුපොළ ආරක්ෂක අංශයේ නිලධාරීන් විසින් ඊයේ (04ද) අත්අඩංගුවට ගෙන ඇත.

24 හැවිරිදි මෙම තරුණිය කටුනායක ගුවන් තොටුපොළ තීරු බදු රහිත සාප්පු සංකීර්ණයේ රූපලාවණ්‍ය භාණ්ඩ අලෙවි කරන සාප්පුවක සේවිකාවකි.

මෙම රත්තරන් ජෙල් ද්‍රාවණය කිලෝ ග්‍රෑම් 05කට අධික බරකින් යුක්ත බව ගුවන් තොටුපොළ ආරක්ෂක අංශයේ නිලධාරීහු පවසති.

මෙලෙස අත්අඩංගුවට පත් තරුණිය සහ රත්තරන් ජෙල් තොගය වැඩිදුර විමර්ශන කටයුතු සඳහා කටුනායක ගුවන් තොටුපොළ රේගු නිලධාරීන් වෙත භාර දී තිබේ .

# ලිට්‍රෝ අද සිට රු.204කින් බසී




■ චාමර පල්ලේගෙදර

පසුගිය මාර්තු මාසයෙන් පසුව අඛණ්ඩව සිව්වැනි වරටත් අද (05ද) සිට ක්‍රියාත්මක වන පරිදි කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලිට්‍රෝ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 204කින් අඩු කිරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව රුපියල් 3186ක්ව පැවැති කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක නව මිල රුපියල් 2982ක් වේ.

එමෙන්ම කිලෝග්‍රෑම් 5ක සිලින්ඩරයක මිල රුපියල් 83කින් පහත හෙළීමත් සමග එහි නව මිල රුපියල් 1198 සහ කිලෝග්‍රෑම් 2 දශම 3ක සිලින්ඩරයක මිල රුපියල් 37කින් අඩු වීමත් සමග එහි නව මිල රුපියල් 561ක් වේ.

ලෝක වෙළෙඳපළේ ගෑස් මිල පහළ යාම, රුපියල ශක්තිමත් වීම ඇතුළු කරුණු කිහිපයක් හේතුවෙන් මෙලෙස ගෑස් මිල අඩු වන අතර ගෑස් මිල සූත්‍රයට අනුව සෑම මසකම පළමු සතියේදී ගෑස් මිල ගණන් සංශෝධනය වේ.

එම ගෑස් මිල සූත්‍රයට අනුව පසුගිය මාසයේදීද කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලිට්‍රෝ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 452කින් අඩු කෙරිණි.

මේ අතර දැනට වෙළෙඳපොළ තුළ කිලෝග්‍රෑම් දෙළහයි දශම පහේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් ලක්ෂ 10ක පමණ හිඟයක් පවතින බැවින් පළමු අදියර යටතේ ලබන අගෝස්තු මාසයේදී

නව ගෑස් සිලින්ඩර හත්දහසක් ගෙන්වීමට නියමිත බව ලිට්‍රෝ ගෑස් සමාගමේ සභාපති මුදිත පීරිස් පැවසීය

එමෙන්ම පවතින ඉල්ලුමට සාපේක්ෂව කෙරවලපිටිය ලිට්‍රෝ ගෑස් සිලින්ඩර නිකුත් කරන ප්‍රධාන කර්මාන්ත ශාලාව ඉදිරි වසර තුන තුළදී ප්‍රමාණවත් නොවිය හැකි බැවින් ලබන වසරේ සිට ඊට විසඳුමක් ලෙස මාබිම කර්මාන්ත ශාලාවද සිලින්ඩර නිකුත් කරන කර්මාන්ත ශාලාවක් බවට පරිවර්තනය කිරීමට සැලසුම් කර තිබේ.

ඒ අනුව එම කර්මාන්ත ශාලාව හරහා ගෑස් සිලින්ඩර පනස් දහසක් නිකුත් කිරීමට බලාපොරොත්තු වන බවද සභාපතිවරයා සඳහන් කළේය.

# හේමසිරි, පූජිත් නිදොස් කොට නිදහස් කිරීම නීතියට පටහැනියි



## නීතිපතිගෙන් ප්‍රකාශයක්

■ කේ.එස්. උදයකුමාර

ජාතික තව්හිත් ජමාත් සංවිධානය විසින් පාස්කු ඉරුදින, ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වීමට නියමිත බවට බුද්ධි තොරතුරු ලැබී තිබියදීත් එය වළක්වා ගැනීමට ක්‍රියා නොකිරීම තුළින් රාජකාරිය සාපරාධි ලෙස පැහැර හැර මිනීමැරීම, සහ ආධාර අනුබල දීම ඇතුළු චෝදනාවලින් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර නිදොස් කොට නිදහස් කිරීමට කොළඹ මහාධිකරණය ගත් තීරණය නීතියට පටහැනි බව නීතිපතිවරයා ඊයේ (04ද) ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ප්‍රකාශ කළේය.

හේමසිරි ප්‍රනාන්දු සහ පූජිත් ජයසුන්දර නිදොස් කොට නිදහස් කරමින් කොළඹ ත්‍රි පුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල දුන් තීන්දුව බලරහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා නීතිපතිවරයා විසින් කර තිබෙන අභියාචනා පෙත්සම් ඊයේ විභාගය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජෙනරාල් ප්‍රියන්ත නාවාන මේ බව දැනුම් දුන්නේය.

ප්‍රීති පද්මන් සූරසේන, යසන්ත කෝදාගොඩ, කුමුදුනී වික්‍රමසිංහ, මහින්ද සමයවර්ධන සහ අර්ජුන ඔබේසේකර යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත පංච පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල ඉදිරියේ මෙම අභියාචනා පෙත්සම් විභාග විය.

නීතිපතිවරයා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ප්‍රියන්ත නාවාන මහතා කරුණු ඉදිරිපත් කිරීම ආරම්භ කරමින් කියා සිටියේ මෙම විත්තිකරුවන් දෙදෙනාට එරෙහිව චෝදනා 855ක් යටතේ වෙන් වෙන් වශයෙන් කොළඹ මහාධිකරණය හමුවේ නඩු දෙකක් පවරනු ලැබූ බවය.

විත්තිකරුවන්ට එරෙහි චෝදනා ගොනු කර තිබූ ආකාරය

### චෝදනා 855ක් යටතේ වෙන වෙනම නඩු දෙකක්

පිළිබඳ විස්තර කළ අතිරේක සොලිස්ටර් ජෙනරාල්වරයා කොළඹ හා තදසන්න ප්‍රදේශවල සිදුවූ පිපිරීම් 07 ක් තුළින් පුද්ගලයින් මරණයට පත්වීම, තුවාල වීම, රාජකාරිය සාපරාධි ලෙස පැහැර හැරීම, ඊට ආධාර අනුබල දීම ඇතුළු චෝදනා ඔවුන් වෙත එල්ල වී තිබූ බවත් සඳහන් කළේය.

පැමිණිල්ලේ සාක්ෂි මෙහෙයවීම අවසන් වීමෙන් පසුව විත්ති වාචකය කැඳවීම හා දේශන ඉදිරිපත් කිරීම සාමාන්‍ය නීතිමය පටිපාටිය වුවත් එම පටිපාටීන් ඉවත දැමූ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කිරීමට තීන්දු කළ බවත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා කියා සිටියේය. මෙහිදී විනිසුරුවරු මතු කළ ප්‍රශ්නයකට පිළිතුරු දුන් අතිරේක සොලිස්ටර් ජෙනරාල්වරයා පැවසුවේ පැමිණිල්ලේ සාක්ෂි විභාගය අවසන් වීමෙන් පසුව විත්තිකරුවන් නිදහස් කරන ලෙස ඔවුන්ගේ නීතිඥවරු පවා අධිකරණය හමුවේ ඉල්ලීම් ඉදිරිපත් නොකළ බවයි.

විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කරමින් ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල දුන් තීන්දුව තුළින් පැමිණිල්ලට සාධාරණ නඩු විභාගයක් නොලැබුණු බවත් එම තීන්දුව නීතියට පටහැනි බවත් අතිරේක සොලිස්ටර් ජෙනරාල්වරයා තර්ක කළේය. වැඩි දුරටත් කරුණු දැක්වූ අතිරේක සොලිසිටර් ජෙනරාල් වරයා පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වීමට නියමිත බවට ප්‍රමාණවත් බුද්ධි තොරතුරු ලැබී තිබියදීත් එය වළක්වා ගැනීමට විත්තිකරුවන් කටයුතු නොකළ බවට චෝදනා කළ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා මෙම විත්තිකරුවන් දෙදෙනා රජයේ ඉහළ නිලතල දැරූ පුද්ගලයින් වන අතර ඔවුන්ට සිය රාජකාරිය පැහැර හරිමින් නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීමට හැකියාවක් නොමැති බවත් සඳහන් කර සිටියේය. අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා වැඩි දුරටත් සඳහන් කළේ ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකිරීම තුළින් ඔවුන් දෙදෙනා එක්ව හෝ වෙන් වෙන් වශයෙන් සිය රාජකාරිය සාපරාධි ලෙස පැහැර හැරීම හේතුවෙන් මෙම ඛේදවාචකය උද්ගත වූ බවයි.

එම ප්‍රකාශයට විරෝධය පළ කළ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ මොහාන් වීරකෝන් මහතා අධිකරණය හමුවේ කරුණු දක්වමින් තම සේවාදයකයා කිසිදු ආකාරයකින් රාජකාරිය පැහැර හැරීම සිදු කර නොමැති බව පැවසීය. රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියාගෙන් ප්‍රහාරය පිළිබඳ තොරතුරු මුලින්ම සිය සේවාදයකයාට ලැබුණේ 2019 වසරේ අප්‍රේල් මස 07 වනද වන අතර එය ලද විගස වැඩි දුර කටයුතු කිරීම සඳහා එය එවක ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා වෙත යොමු කිරීමට ඔහු කටයුතු කළ බවත් ජනාධිපති නීතිඥවරයා කියා සිටියේය. ඒ අනුව තම සේවාදයකයා කිසිදු ආකාරයකින් රාජකාරිය පැහැර හැරීමක් සිදු කර නොමැති බවත් ජනාධිපති නීතිඥවරයා තර්ක කළේය.

සහරාන් හෂීම් පිළිබඳව සියලු දෙනා 2017 වසරේ සිට දැනසිටි බවත් ප්‍රහාරයක් එල්ල වීමට නියමිත බවට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානි නිලන්ත ජයවර්ධන මහතා වෙත ලැබී තිබුණේ තොරතුරක් මිස බුද්ධි තොරතුරක් නොවන බවත් ජනාධිපති නීතිඥවරයා වැඩි දුරටත් කියා සිටියේය.

වැඩිදුර නඩු විභාගය අද (05ද) දින තෙක් කල් තැබුණි.

## රුපියල යළි අළු ගසා දමයි

■ හෂිනි කුලතුංග

ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල යළි ශක්තිමත් වී ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඊයේ ( 4 වැනිද) නිවේදනය කර තිබේ.

ඒ අනුව ඩොලරයේ ගැනුම් මිල රුපියල් 299.87 ලෙසත් ඩොලරයේ විකිණුම් මිල රුපියල් 314.98 ලෙසත් සඳහන් වෙයි. මහ බැංකුව අවසන් වරට විනිමය අනුපාතය නිකුත් කළ ගිය මස 28 වැනිද විකුණුම් මිල රුපියල් 316 ශත 67 ක් ලෙසත් ගැනුම් මිල රුපියල් 301 ශත 15 ලෙස දැක්විණි.

## මිල ප්‍රදර්ශනය නොකර කෑම විකිණූ කඩ පහකට නඩු



■ චාමර පල්ලේගෙදර

දිවයින පුරා පිහිටි ආපන ශාලා සහ හෝටල්වල අලෙවි කරන කෙටි ආහාරවල මිල ප්‍රදර්ශනය නොකරන ස්ථාන සොයා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඊයේ (04ද) සිට වැටලීම් ආරම්භ කළේය.

ඒ අනුව මෙම වැටලීම් මට්ටක්කුලිය ප්‍රදේශයෙන් ආරම්භ කළ අතර ඊයේ (04ද) දිනයේදී පමණක් ආපන ශාලා සහ හෝටල් 15කට පමණ නඩු පැවරීමට පියවර ගෙන තිබුණි.

මෙහිදී කල් ඉකුත් වූ බයිට් පැකට්, කොත්තු, රයිස් සහ බනිස් ඇතුළු කෙටි ආහාරවල මිල ප්‍රදර්ශනය නොකිරීම හේතුවෙන් මෙලෙස නඩු පැවරීමට පියවර ගත් බව වැටලීම් නිලධාරීහු සඳහන් කළහ.

එම වැටලීම් අතර පාලන මිල ඉක්මවා බිත්තර අලෙවි කළ වෙළෙඳ සලක්ද වේ.

# අධ්‍යාපනයේ සේවා දෙකකට එකවර වැටුප් වර්ධක දොළහක් දෙන යෝජනාවක්

■ නිලන්ත මදුරාවල

අධ්‍යාපන පරිපාලන සේවයට සහ ගුරු අධ්‍යාපනඥ සේවයට වැටුප් වර්ධක දෙළහක් එකවර ලබා දීම සඳහා වන යෝජනාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කරනු ලැබ ඇත. මෙම යෝජනාව සකස් කර ඇත්තේ අධ්‍යාපන පරිපාලන සහ ගුරු අධ්‍යාපනඥ සේවා වෘත්තීය සමිති නිලධාරීන්ගේ ඉල්ලීම අනුවය.

වසර ගණනක් තිස්සේ පැවැති ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉකුත් වසරේ ජනවාරි මාසයේ සිට ඉවත් කිරීමට අමාත්‍යාංශය පියවර ගැනීමෙන් පසු අධ්‍යාපන පරිපාලන සහ ගුරු අධ්‍යාපනඥ සේවා නිලධාරීන්ගේ වැටුප් තල හා ගුරුවරුන්ගේ වැටුප් තල අතර බරපතළ විෂමතාවක් ඇති විය. වෘත්තීය සමිති අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියේ එම විෂමතාව ඉවත්කර දෙන ලෙස ය.

ගුරු අධ්‍යාපනඥ සේවයේ සහ ගුරු සේවයේ ඇතැම් ශ්‍රේණිවල වැටුප් තල අතර වෙනස රුපියල් තිස් දහසක් පමණ වන බව ගුරු අධ්‍යාපනඥ සේවා නිලධාරීන්ගේ වෘත්තීය සමිතියේ ලේකම් ධම්මික මිරිහාන 'අරුණ'ට පැවසීය.

# පන්තියේ වහලෙට කොස් ගසක් කඩා වැටී සිසුන් අටක් රෝහලට

■ සාලිය ගමසිහ ආරච්චි - කෑගල්ල

කෑගල්ල ඇකිරියගල කනිටු විදුහලේ පන්ති කාමරයක් මතට කොස් ගසක් කඩා වැටී සිසුන් අටදෙනකු කෑගල්ල මහ රෝහලට ඇතුළත් කර තිබේ.

ඊයේ (04ද) දහවල් 12.30ට පමණ වර්ෂාවත් සමග එම ප්‍රදේශය හරහා හමාගිය සුළං හේතුවෙන් එම විද්‍යාලයේ හතර වසර පිහිටි ගොඩනැගිල්ලේ වහලය මතට ආසන්නයේ තිබූ කොස් ගසක් ඉදිරී වැටී තිබේ.

වහලය මතට ගස වැටීමත් සමග වහලයේ උළු කැට සිසුන්ගේ හිස මතට වැටී සිසුන්ගේ හිසට තුවාල සිදු වී තිබේ.



පන්ති කාමරයේ වහලය මතට කොස් ගස වැටී තිබූ අයුරු

තුවාල ලැබූ සිසුන් ත්‍රිරෝද රථ මගින් කෑගල්ල මහ රෝහල වෙත ගෙන ඒමට ගුරුවරුන් පියවර ගෙන ඇති අතර ඉන් සිසුන් හත්දෙනකු සහ එක් සිසුවියක් කෑගල්ල මහ රෝහලට ඇතුළත් කෙරිණි.

ඉන් එක් සිසුවෙක්ගේ උරහිස මතට උළු කැටයක් වැටීම හේතුවෙන් උරහිසේ බිඳුමක් සිදුවී ඇත්ද යන්න x කිරණ පරීක්ෂාවකින් පසුව තහවුරු කරගන්නා බව රෝහල් කාර්ය මණ්ඩලය පැවසූහ.

රෝහලට ඇතුළත් කළ සිසුන් අතරින් පස් දෙනකු ප්‍රතිකාර ලබා දීමෙන් පසු රෝහලෙන් මුදා හැර තිබිණ.

# දින හතරක් තෙල් නැතිව වේලුණු රාජගිරිය සිපෙට්කෝ සංස්ථාව භාරයට

■ අශිකා ජයවීර

අවම ඉන්ධන සංචිත ප්‍රමාණයක් පවත්වාගෙන යන බවට දිගින් දිගටම පාරිභෝගිකයන්ගෙන් ලැබුණු පැමිණිලි හේතුවෙන් රාජගිරිය සිපෙට්කෝ ඉන්ධන පිරවුම්හල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව භාරයට ගෙන ඇත.

ඊයේ [ 04ද ] ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ බස්නාහිර පළාත් වැඩබලන ප්‍රාදේශිය පරිපාලක දීපාල් මදුරප්පෙරුම ඇතුළු නිලධාරීන් පිරිසක් මෙම ඉන්ධන පිරවුම්හලට පැමිණ පරීක්ෂා කිරීමෙන් අනතුරුව පිරවුම්හල සංස්ථාව භාරයට ගෙන ඇත.

සංස්ථාවේ බස්නාහිර පළාත් වැඩබලන ප්‍රාදේශීය පරිපාලක දීපාල් මදුරප්පෙරුමපෙන්වා දෙන්නේ පසුගිය 01 වැනිද සිට ඊයේ දක්වාම කිසිදු ඉන්ධන වර්ගයක් මෙම ඉන්ධන පිරවුම්හලේ තිබී නොමැති බවය.

අද [ 05ද ] දිනයේ මෙම පිරවුම්හල සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වන බවත් මෙම ඉන්ධනහලේ පොම්ප සියල්ල මුද්‍රා තබා ඇති බවත් ඔහු පැවසුවේය.

සෑම වර්ගයකම ඉන්ධනවලින් සියයට පනහක සංචිතයක් පිරවුම්හලේ පවත්වාගෙන යා යුතු බවට ඉන්ධන පිරවුම්හල්හිමියා සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර ගිවිසුමක් පවතින අතර එයට අනුව කටයුතු කිරීම අනිවාර්ය බව ඔහු පැවැසීය.

හෙතෙම කියා සිටින්නේ දින ගණනාවක් තිස්සේ මෙ ම ඉන්ධන පිරවුම්හලේ ඉන්ධන සංචිත නොමැති බවට පාරිභෝගිකයන් ඛනිජ තෙල් සංස්ථාවට පැමිණිලි කර ඇති බවය.

එමෙන්ම ඉන්ධනහලට අවශ්‍ය ප්‍රමාණයට ඉන්ධන සංචිත ඇණවුම් කිරීමට එම පිරවුම්හලේ අයිතිකරු කටයුතු නොකිරීම ද මෙම පිරවුම්හල සංස්ථාව භාරයට ගැනීමට හේතුවක් වී ඇත.

නමුත් මෙම පිරවුම්හලේ හිමිකරු පවසන්නේ තම පිරවුම්හලේ ඉන්ධන සංචිත තිබූ බවත් කිසි දිනක තෙල් හිඟයක් ඇති නොවූ බවත්ය.

## ග්‍රහචාරය

2023 ජූලි 05
වැනි බදාදා

රාහු කාලය
මධ්‍යහ්න 12.15 - සවස 1.49
රාත්‍රි 12.15 - රාත්‍රි 1.41

ශුභ දිශාව - දකුණ
මරු සිටින දිශාව - නිරිත

### මේෂ
සෘජු හැඟීම්

වේගවත් හෝ සෘජු හැඟීම් තවදුරටත් පාලනය කරගනු ඇත. විශේෂයෙන් පොදු කටයුතු හා සම්බන්ධයෙන් තරමක වෙනසක් විය හැකිය. ඒ ඔස්සේ රැකියාව කරන තැන අන්‍යයන්ගේ හෝ විශ්වාසය දිනා ගැනීමටද උත්සාහ නොවේ.

### වෘෂභ
මෘදු සිතිවිලි

අනන්‍යයන් වෙත මෘදු සිතිවිලි ඇති කළද එහි සීමාවන් හඹායන්න. තරගකාරිත්වයටම ලොල්වීම පාඩු සහිත වේ. වඩා දැහැමි පෙවතකට සිත යොමු කළ හැකිය. අන්තවාදී ලෙසට නොසිතා කටයුතු කරන්න.

### මිථුන
ජලයෙන් ප්‍රවේශම් වෙන්න

පෙර දින පැවැති අදහස් අද දිනයේද බොහෝ දුරට පවතිනු ඇත. වරකට අදහස් කිහිපයක් ක්‍රියාත්මක කිරීම තරමක් අවුල් සහගත විය හැකිය. ජලය සම්බන්ධ කටයුතුවලදී වඩාත් සැලකිලිමත් වන්න.

### කටක
විනෝදකාමී අදහස්

උදේ කාලය සාමාන්‍යයෙන් අපහසු බවක් දැනේ. සෙම්ප්‍රතිශ්‍යාව හෝ සෙම සම්බන්ධයෙනි. විනෝදකාමී අදහස් ඇති වුවද සීමාවන් පාලනය කරගන්න. වෙළෙඳ කටයුතුවල වාසි සහගත බවක් දැනේ.

### සිංහ
තරමක් කරදර

උදය කාලය සාමාන්‍යයෙන් ශුභදයකයි. සවස් කාලය තරමක් කරදර සහිතයි. ඉක්මන් සිතිවිලි ඇතිවේ. එහෙත් කල්පනාකාරීව කටයුතු කරන්න. බාධක මග හරවා ගත හැකිවේ.

### කන්‍යා
මූල්‍ය වාසි

ශාස්ත්‍රීය ප්‍රකාශන මුද්‍රණ කටයුතුවල යෙදෙන අයට යම් යම් පහසුකම් ඇති විය හැකිය. රාජ්‍ය අංශයේ අයට නම් වඩාත් විශේෂයි. අන්‍යයන්ගෙන් මූල්‍ය වාසි ලැබීමටද ඉඩකඩ ඇත. හදිසි තුවාල ගැන කල්පනාකාරී වන්න.

### තුලා
හිතේ සන්සුන්ගති

රැකියා කටයුතුවලදී වැඩ අධික වුවත් එහි ප්‍රයෝජන උපරිම කර ගැනීමට උත්සාහ කරන්න. හිතේ සන්සුන්ගති පාලනය කරගත හැකිවේ. දරුවන්ගේ වැඩ කටයුතු ප්‍රමාද හෝ සංකීර්ණ බවක් ඇතිවේ.

### වෘශ්චික
කරදර සහිතයි

එදිනෙද වැඩ කටයුතුවල පහසුවක් දැනේ. අන්‍යයන් හා සුහදවීමට උත්සාහ ගනී. විශේෂයෙන් පොදු කටයුතු හෝ පාර්ශ්විය කටයුතු සම්බන්ධයෙනි. නිවසේ කටයුතු පාලනය කර ගන්න. කරදර සහිතයි.

### ධනු
කැපී පෙනේ

පොදු කටයුතුවලදී විශේෂයෙන් කැපී පෙනෙන බවක් ඇති කරයි. අන්‍යයන් හා සුහදව වැඩ කිරීමට උනන්දු වේ. කතාවෙන් ඉතා සුබ බවක් ඇති කරනු ඇත. භූමි කෘෂි අංශවලින් යමක් ඉතිරියට ඉඩ ලැබේ.

### මකර
ශරීරයේ උෂ්ණ ගති

කතා බහ සම්බන්ධව ඉතාමත් ප්‍රවේසම්ව කටයුතු කරන්න. හිතවත්කම් අන්‍යයන් වරදවා තේරුම් ගත හැකිය. ශරීර උෂ්ණත්ව ගතියක් දැනේ.

### කුම්භ
සිතට දැනෙන වැඩ

හැකියාව හා ශක්තිය ඇතත් මනාව පාලනය කොට ගත යුතුවේ. වැඩ කටයුතුවල අවුල් ස්වභාවයක් ඇති කළ හැකි බැවිනි. සිතට දැනෙන වැඩ ඇති විය හැක. අන්‍යයන් හා එක්ව වැඩ පාලනය කරගන්න.

### මීන
ලැබීම් යහපත්

මිල මුදල් පරිහරණයන් ගැන සැලකිලිමත් වන්න. බරපතළ පාඩු තත්ත්වයන් නොපෙනුනද ප්‍රශ්නකාරී තත්ත්වයක් ඇති කළ හැකිය. ජලය සම්බන්ධ ක්ෂේත්‍රවල වැඩ කරන අයගේ ලැබීම් වඩාත් යහපත් වේ.

# 'තායි රාජා' ගෙනියන්න හැදුවොත් නඩත්තු වියදම් ඉල්ලා නඩු දානවා



## තෑගි දී නැවත ඉල්ලීම සදාචාරාත්මක නැහැ

### - හිටපු දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න

■ අසංකා උදේශිනී

**තායි රජ පවුලෙන් මහනුවර ශ්‍රී දළදා මාලිගාවට පූජා කළ 'තායි රාජා' ඇතා දැනට පවතින වාතාවරණය මත නැවත තායිලන්තයට ගෙන යෑමට උත්සාහ කළහොත් ඇතාගේ නඩත්තුවට ගිය වියදම් ඉල්ලා නඩු පවරන බව හිටපු දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න පවසයි.**

'තායි රාජා' ලංකාවට ගෙනවිත් වසර 37 ක් පමණ වන බවත් ඇතා කිසිදු හිරිහැරයකින් තොරව සිටින නමුත්, එන්.ජී.ඕ. කණ්ඩායම් තායිලන්තයට වැරැදි තොරතුරු දෙන බවත් හිටපු දියවඩන නිලමේවරයා සඳහන් කළේය. තවද දුන්නු තෑග්ග නැවත ඉල්ලීම සදාචාරාත්මක නොවන බවද ඔහු කීවේය.

"තායිලන්තයේ ජනතාව ඉල්ලුවොත් ශ්‍රී ලංකාවට දුන්නු ඉතිරි අලි දෙන්නත් නැවත ගෙන්වා ගන්නා බව තායිලන්තයේ පරිසර ඇමැති කියලා තිබුණා.

'තායි රාජා' ලංකාවට ගෙනාවේ 1986 වසරේදී. දළදා මාලිගාවට ඇතකු පූජා කරන්න කියලා මම එරට භූමිපෝල් මහ රජුගෙන් ඉල්ලීමක් කළා. ඒ අනුව තමයි රජ පවුලෙන් මේ ඇතා ලැබුණේ. ඇත් පැටවා ගෙනාවේ ඇමෙරිකානු යුද ගුවන් යානයකින්. ඒ සඳහා ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනගෙන් විශේෂ අවසරයක් ගන්නත් සිදුවුණා. යුද ගුවන් යානයක් ලංකාවට ඒම ගැන ලොකු ආන්දෝලයකුත් ඒ කාලේ රටේ ඇතිවුණා.

ඇත් පැටවා ගෙනා ද සිට පශු වෛද්‍ය විජිත කුරුවිට, මහාචාර්ය නෙවිල් සිල්වා සහ වෛද්‍ය දංගොල්ල ඇතුළු පිරිසගේ අධීක්ෂණය යටතේ හැදුණේ. 'තායි රාජා' ට කිසිම හිරිහැරයක් වෙලා නැහැ. නමුත් 'මුතුරාජා' ගේ ප්‍රශ්නය නිසා තායිලන්තයෙන් දුන් ඉතිරි අලි දෙදෙනාද යළි එරටට ඉල්ලන උත්සාහයක් පෙනෙනවා.

'මුතු රාජා' ඇතාත් දළදා මාලිගාවට දෙන්නයි ගෙනාවේ. නමුත් චන්ද්‍රිකා ජනාධිපතිනිය ඇතා කන්දේ විහාරයට දුන්නා.

දළදා මාලිගාවට දුන්න ඇතා යළි ඉල්ලුවොත් දෙන්න සූදානම් විය යුතු නැහැ. ඒ සතා වෙනුවෙන් අපේ රට මේ දක්වා රුපියල් කෝටි ගණනක් වියදම් කර තිබෙනවා. මගේ කාලයෙත් එහෙමයි. දැනුත් එහෙමයි. එහෙම ගෙනියන්න උත්සාහ කළහොත් නඩත්තුවට ගිය වියදම ඉල්ලා අනිවාර්යයෙන්ම මම නඩු පවරනවා" යැයි හිටපු දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න වැඩිදුරටත් කීවේය.

# පොලී රහිත ශිෂ්‍ය ණයේ ප්‍රමුඛතාව තාක්ෂණික පාඨමාලාවලට



### - රාජ්‍ය ඇමැති රංජිත් සියඹලාපිටිය

■ හේෂාර සේනාල් සෝමරත්න

**පෞද්ගලික විශ්වවිද්‍යාල වල තාක්ෂණික රැකියා අභිමුඛ පාඨමාලා හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන්ට පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රමුඛතාව හිමිවන බව මුදල් රාජ්‍ය ඇමැති රංජිත් සියඹලාපිටිය පැවසීය.**

මෙම ණය මුදලේ සම්පූර්ණ පොලී මුදල රජය විසින් දරන බවද ඇමැතිවරයා සඳහන් කළේය. අදාළ ණය යෝජනා ක්‍රමයේ 7 වැනි අදියර සඳහා අගෝස්තු 7 වැනිද දක්වා අයැදුම් කළ හැකි අතර 2019, 2020 සහ 2021 වර්ෂයන්හි උසස් පෙළ විභාගය සමත් සිසුන්ට ඒ සඳහා අයැදුම් කළ හැකි ය. ඊට අදාළ අයදුම්පත් www.studentloans.mohe.gov.lk වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගතව යොමු කළ හැකිය. එම වෙබ් අඩවියට පිවිස පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයේ ශිෂ්‍ය අත්පොත පරිශීලනය කිරීමෙන් අදාළ සියලු තොරතුරු ලබා ගත හැක.

වැඩි විස්තර සඳහා 070-3555970-79 යන දුරකථන අංක අමතන ලෙස මුදල් රාජ්‍ය අමාත්‍යාංශය ඉල්ලීමක් කරයි.

# උ.පෙළ ඇගයීම් අවසන් කළ ඇතැම් ගුරුවරුන්ට මුදල් අත්තිකාරම් ගෙවා නැහැ



### - ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් කියයි

■ නිලන්ත මදුරාවල

**උසස් පෙළ උත්තර පත්‍ර ඇගයීම් අවසන් කළ ඇතැම් ගුරුවරුන්ටත් මේ දක්වා අත්තිකාරම් මුදල් ලැබී නොමැති බව ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝශප් ස්ටාලිං 'අරුණ'ට ඊයේ (04 වැනිදා) පැවසීය.**

විභාග දෙපාර්තමේන්තුව පොරොන්දු වූයේ ඇගයීම් ආරම්භ කරන විට ම අත්තිකාරම් ලබා දෙන බවට යැයි ද මේ අයුරින් ගුරුවරුන් රැවටීම නොකළ යුත්තක් බව ද කී ඒ මහතා මෙවැනි ක්‍රියාමාර්ග හේතුවෙන් ගුරුවරුන් අතර දෙපාර්තමේන්තුව කෙරෙහි ඇති විශ්වසනීයත්වය බිඳෙන බවද සඳහන් කළේය.

අත්තිකාරම් වශයෙන් රුපියල් පහළොස් දහසක් ලබා දෙන බවට මුලින් පොරොන්දු වුවද ලබා දුන්නේ රුපියල් දසදහසක් බවත් එම මුදල හෝ සියලු ගුරුවරුන්ට ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොමැති බවත් කී ප්‍රධාන ලේකම්වරයා දෙපාර්තමේන්තුව ට ඇත්තේ කෙසේ හෝ වැඩේ කර ගැනීමේ අවශ්‍යතාව බවද පැවසීය.

උත්තර පත්‍ර ඇගයීම් සිදු කෙරෙන්නේ පාසල් පවත්වාගෙන යන අතරතුර දී බැවින් විද්‍යා අංශයේ විෂයයන් ඇගයීම් කිරීමේ දී ගුරුවරුන් දැඩි අපහසුතාවට ලක් වන බව ද ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වැඩි අවධානයක් යොමු කළ යුතු බව ද ඒ මහතා කීවේය.

මේ සම්බන්ධයෙන් විමසීමට විභාග කොමසාරිස් ජනරාල් අමිත් ජයසුන්දර දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට අප ගත් උත්සාහයන් අසාර්ථක විය.

# 87 පිරෙන කොටම සත්තු වත්තට ලක්ෂ 27ක්

■ අනීෂා මානගේ

දෙහිවල සත්ත්වෝද්‍යානයට අවුරුදු 87ක් පිරුණුද රුපියල් ලක්ෂ විසිහතකට අධික ආදායමක් උපයාගැනීමට හැකිවූ බව සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

සත්ත්වෝද්‍යානයේ උපන්දිනය වෙනුවෙන් විවිධ වැඩසටහන් සංවිධාන කර තිබීම හේතුවෙන් මෙලෙස විශාල ආදායමක් උපයාගැනීමට හැකිව තිබේ. පසුගිය දිනවලට සාපේක්ෂව මෙය ඉතාමත් හොඳ ආදායමක් බව සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව පවසන අතර, එලෙස ආදායම වැඩිවී ඇත්තේ වයස අවුරුදු 12ට අඩු දරුවන්ට හා පාසල් සිසුන්ට නොමිලේ ඇතුළුවීමට පහසුකම් සලසා තිබියදීය.

දෙස් විදෙස් සංචාරකයන්ගේ ප්‍රවේශපත්‍ර ආදායම හා මැකෝ, පෙලිකන්, ජිරාෆ් හා අලින් ඇතුළු සතුන්ට ආහාර ලබාදීම, සාමාජික ගාස්තු ඇතුළු අනෙකුත් වැඩසටහන්වලින් රුපියල් විසිහත්ලක්ෂ පනස් හතරදහස් හයසිය හැත්තෑ හතක (2,754,677) ආදායමක් උපයා ගැනීමට හැකිව තිබේ. දෙස් විදෙස් සංචාරකයන් 8849 දෙනකු පෙරේද (03 වැනිද) සතුන්වත්ත නැරඹීමට හා වැඩසටහන් සඳහා සහභාගී වීමට පැමිණ තිබේ.



නැරඹීමට පැමිණ සිටි පිරිස.....





චීන ගුවන් යානයෙන් පැමිණි පිරිස පිළිගත් අවස්ථාව

# තෙවසරකට පසු චීන ගුවන් යානා ලංකාවට

■ ටී.කේ.ජී. කපිල - කටුනායක

කොරෝනා වසංගතයෙන් පසු 'එයාර් චයිනා (Air China)' ගුවන් සේවය යළි ශ්‍රී ලංකාව සමග ගුවන් ගමන් ආරම්භ කරමින් පළමු ගුවන් යානය පෙරේද (03 වැනිද) රාත්‍රී කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබේ.

මීට වසර තුනකට පමණ පෙර චීන ජාතික ගුවන් සේවය විසින් ශ්‍රී ලංකාව වෙත සිදු කළ ගුවන් ගමන් තාවකාලිකව නවතා දමා තිබිණි.

මෙම ගුවන් ගමන සඳහා ඒ- 320 එයාර් බස් වර්ගයේ ගුවන් යානයක් යොදවා තිබිණි. මගීහු 142දෙනෙක් සහ කාර්ය මණ්ඩලයේ නව දෙනෙක් එම ගුවන් යානයෙන් පැමිණ සිටියහ. මින් පසුව මෙම චීන ජාතික ගුවන් සේවයේ ගුවන් යානා සඳුද, බදාද සහ සිකුරාද දිනවල චීනයේ චෙන්ඩු නුවර සිට රාත්‍රී 08.55ට කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණීමට නියමිත අතර, යළිත් එම ගුවන් යානා එදිනම රාත්‍රී 10.15ට කටුනායක සිට චීනයේ චෙන්ඩු බලා පිටත්ව යාමට නියමිතය.

# එක් ලක්ෂ අසූදහසක කිරි බෝතල් උස්සලා



සී.සී.ටී.වී. දර්ශන

■ බිමල් ශ්‍යාමන් ජයසිංහ - බණ්ඩාරගම

නුගේගොඩ, දෙල්කඳ හන්දියේ වෙළෙඳසලක් ඉදිරිපිට නවතා තිබූ ලොරියකින් රුපියල් එක් ලක්ෂ අසූදහසක් වටිනා කිරි බෝතල් තොගයක් සොරා ගත් පුද්ගලයන් දෙදෙනකු සී.සී.ටී.වී. දර්ශන ඔස්සේ සිදුකළ විමර්ශනවලදී නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

එලෙස සොයාගත් කිරි බෝතල් තොගයෙන් බෝතල් 12ක් සහ සොරකමට යොදාගත් ලියාපදිංචි අංකය වෙනස් කරන ලද ත්‍රිරෝද රථය ද පොලිසිය භාරයට ගෙන තිබේ. ත්‍රිරෝද රථයේ ලියාපදිංචි අංකය කළු පාට ස්ටිකර් අලවා වෙනස් කර තිබූ බව ද පොලිසිය පැවසීය.

මෙලෙස කිරි බෝතල් ප්‍රවාහනය කරමින් තිබූ ලොරිය නුගේගොඩ, දෙල්කඳ ප්‍රදේශයේ වෙළෙඳසලක් ඉදිරිපිට නවතා රියැදුරු සහ සහායක වෙළෙඳසලට ගිය අවස්ථාවේදී සැකකරුවන් දෙදෙනා ත්‍රිරෝද රථයෙන් ලොරිය අසලට පැමිණ කිරි බෝතල් තොගයක් සොරා ගෙන ගොස් තිබිණි.

සී.සී.ටී.වී. දර්ශන අනුව සිදුකළ විමර්ශනවලදී එම ත්‍රිරෝද රථය හඳුනාගෙන වැල්ලම්පිටිය කළු පාලම අසලදී සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගත් බව පොලිසිය කීවේය.

සොරා ගත් කිරි බෝතල් 12ක් එක් සැකකරුවකුගේ නිවසේ සඟවා තිබියදී පොලිසිය විසින් සොයාගෙන ඇත. සැකකරුවන්ගෙන් සිදු කළ ප්‍රශ්න කිරීමේදී අනෙක් කිරි බෝතල් අඩු මිලට විවිධ පුද්ගලයන්ට ලබාදී මුදල් ලබාගත් බව අනාවරණය වී තිබේ.

# 'හලෝ' 28ක් කොල්ල කෑ පෙම් යුවළ දැලේ

■ එෆ්. අස්ලම්

කොළඹ හා තදසන්න ප්‍රදේශ රැසකදී දුරකතන කොල්ල කෑ බව පැවසෙන පෙම්වතුන් යුවළක් ජංගම දුරකතන 28ක් සමග කඩුවෙල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

ඔවුන් සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 10කට අධික ප්‍රමාණයක් ද සොයාගෙන ඇත.

කඩුවෙල පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කාන් වීරසිංහට ලද තොරතුරකට අනුව එම පොලිසියේ අපරාධ අංශ ස්ථානාධිපති රුවන් චතුරංග ඇතුළු නිලධාරීන් විසින් කඩුවෙල නගරයට නුදුරු ප්‍රධාන පෙළේ තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලයක් අසලදී හෙරොයින් ග්‍රෑම් 05ක් සමගින් 22 හැවිරිදි තරුණියක අත්අඩංගුවට ගෙන ඇත.

එලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ හෙරොයින් භාවිතයට ඇබ්බැහි වී සිටි මොනරාගල ප්‍රදේශයේ පදිංචි තරුණියකි. ඇඟලුම් කර්මාන්තශාලාවක සේවය කරමින් සිටියදී හෙරොයින් භාවිතයට ඇඩිව ඇබ්බැහි වූ තැනැත්තියක වූ ඇය ජාඇල ප්‍රදේශයේ පදිංචි 24 හැවිරිදි තරුණයකු සමග විවාහ නොවී එකට ජීවත්ව ඇතැයි විමර්ශනවලදී හෙළිව තිබේ.

එමෙන්ම තම පෙම්වතා විසින් හෙරොයින් ජාවාරම් කරන බවත් ඔහුගේ අවශ්‍යතාව මත තම ඒවා සන්තකයේ තබා ගත් බවත් සැකකාරිය පොලිස් ප්‍රශ්න කිරීම් හමුවේ පවසා ඇත.

මේ අනුව දින අටක් සිදුකළ විමර්ශනවලින් අනතුරුව සැකකාර පෙම්වතා පෙරේද (03 වැනිද) පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත්තේ හෙරොයින් ග්‍රෑම් 05ක් ද සන්තකයේ තිබියදීය.



වැටලීම කළ පොලිස් නිලධාරීන් සහ සොයාගත් දුරකතන...

සැකකරු සන්තකයේ තිබූ ඇපල් වර්ගයේ ජංගම දුරකතනයක් ද පොලිසිය භාරයට ගෙන ඇතත්, ඔහුට එහි මුරපදය අමතකව තිබිණි. එය සොරකම් කළ එකක් බව සැකකරු පසුව පාපොච්චාරණය කර තිබේ.

සැකකරුගේ යතුරුපැදියේ තිබී තවත් ස්මාර්ට් ජංගම දුරකතන පහක්ද සොයාගෙන ඇත. ඒවාද විවිධ ප්‍රදේශවලින් සොරාගත් ඒවා බවද අනාවරණය වී ඇත. මීට අමතරව සැකකරුගෙන් සිදුකළ වැඩිදුර ප්‍රශ්න කිරීම්වලදි කඩුවෙල, අතුරුගිරිය හා මාලඹේ ප්‍රදේශවල දුරකතන අලුත්වැඩියා කරන ස්ථානවලට විකුණා තිබියදී ජංගම දුරකතන 27ක් ද පොලිසිය විසින් සොයාගෙන තිබේ.

මෙම යුවළ කලක පටන් යතුරුපැදියේ ගමන් කරමින් මාලඹේ, අතුරුගිරිය, බියගම, කඩුවෙල සහ නවගමුව ආදී ප්‍රදේශ ගණනාවක මාර්ග අසල දුරකතන ඇමතුම්වල රැඳී සිටින පුද්ගලයන්ගේ දුරකතන සොරකම් කර ඇතැයි පොලිසිය වැඩිදුරටත් සඳහන් කළේය.

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

# ලක්ෂ 50ක මැණික් අරගෙන අගරු චෙක් අටක් දීලා

## ව්‍යාපාරිකයකු සැකපිට අත්අඩංගුවට

රුපියල් ලක්ෂ පනහකට ආසන්න වටිනාකමකින් යුතු නිල් මැණික් ගල් 10ක් ලබාගෙන අගරු චෙක්පත් ලබා දුන් බව කියන මැණික් ව්‍යාපාරිකයකු සැකපිට අත්අඩංගුවට ගෙන ඇතැයි කළුතර විශේෂ අපරාධ විමර්ශන අංශය සඳහන් කරයි. බේරුවල ප්‍රදේශයේ මැණික් ව්‍යාපාරිකයන් දෙදෙනකු සිදුකළ පැමිණිලි දෙකකට අදාළව සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකාර ව්‍යාපාරිකයා මීට මාස දහයකට පමණ ඉහත දී බේරුවල ප්‍රදේශයේ ව්‍යාපාරිකයකුගෙන් රුපියල් තිස්තුන් ලක්ෂ දහතුන් දහසක් වටිනා නිල් මැණික් ගල් නවයක් ලබාගෙන ඒ වෙනුවෙන් චෙක්පත් ලබාදී තිබූ බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී තිබේ. එලෙසම ඔහු එම ප්‍රදේශයේම තවත් මැණික් ව්‍යාපාරිකයකුගෙන් රුපියල් දහතුන් ලක්ෂ පනස්දහසක් වටිනා නිල් මැණිකක් ලබාගෙන ඒ වෙනුවෙන් ද චෙක්පත් ලබාදී තිබූ බව පොලිසිය කීවේය. සැකකාර ව්‍යාපාරිකයා මැණික් ව්‍යාපාරිකයන් දෙදෙනාට ලබාදී තිබූ චෙක්පත් අට එම ව්‍යාපාරිකයන් විසින් බැංකුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒවා අගරු චෙක්පත් බව අනාවරණය වී තිබූ බව ද පොලිසිය පැවසීය.

# කෝටියක මුදල් හා රන් බඩු කොල්ලයේ සැකකරුවන් තිදෙනකු අල්ලයි

■ අනීෂා මානගේ

ඌරුබොක්කේ ව්‍යාපාරිකයකුගේ නිවෙසට ඇතුළු වී ගිනිඅවි පෙන්වා නිවැසියන් බියගන්වා රුපියල් කෝටියකට අධික වටිනාකමින් යුතු රන් භාණ්ඩ, ජංගම දුරකතන හා මුදල් කොල්ලෑමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් තිදෙනකු පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ ඇත.

මෝටර් රථයකින් ආයුධ සන්නද්ධව පැමිණි පිරිසක් ඌරුබොක්ක, හුලංකන්ද පාරේ පිහිටි ව්‍යාපාරිකයකුගේ නිවසකට ඇතුළුවී රුපියල් එක් කෝටි එක්ලක්ෂ අනූදෙදහසක් වටිනා රන් භාණ්ඩ, මුදල් හා ජංගම දුරකතන ඉකුත් මස 11 වැනිද කොල්ල කා පලා ගොස් තිබිණි. අදාළ ව්‍යාපාරිකයාට රෝගාතුර පුතකු සිටින අතර, ඔහුගේ සුවදුක් විමසීමට ඥාතීන් සිවු දෙනකුද පැමිණ සිටි අවස්ථාවේ දී මෙම කොල්ලකරුවන් නිවෙසට පැමිණ ඇතැයි පොලිසිය කීවේය. එම අවස්ථාවේදී නිවෙසේ සිටි පිරිස කාමරයකට දමා මුදල් හා භාණ්ඩ කොල්ල කෑ පිරිස ඔවුන් පැමිණි මෝටර් රථයෙන්ම පලා ගොස් ඇත.

සැකකරුවන් පැමිණි මෝටර් රථය වලස්මුල්ලේ තිබියදී මීට පෙර පොලිසිය විසින් සොයාගෙන තිබූ අතර, එය පොලිස් නිලධාරියකුට අයත් බව කියයි. කොල්ලයට පැමිණි සැකකරුවන් මෙම රථය කුලී පදනම මත පොලිස් නිලධාරියාගේ සොහොයුරියකගෙන් ලබා ගෙන ඇත. කොල්ලයෙන් පසු සැකකරුවන් පලා යද්දී එම රිය අනතුරට ලක්ව ඇති අතර සැකකරුවන් එහි අලාභය ද ගෙවා රථය නැවත භාර දී ඇතැයි පොලිසිය කියයි. කොල්ල කෑ මුදල් බවට සැකකරන රුපියල් එකොළොස් ලක්ෂ හැටපන්දහසක මුදලක් ඕමල්පේ සැකකරුගේ නිවෙස ආසන්නයේ තේ ගසක් යට කාණුවක වළ දමා තිබියදී සොයාගෙන ඇත. මෙම කොල්ලයට අදාළ තවත් සැකකරුවන් හඳුනාගෙන ඇති අතර, පලා ගොස් සැඟව සිටින එම සැකකරුවන් සොයා විමර්ශන සිදු කරයි.



උත්සවයට සහභාගි වූ ආරාධිතයන් ආගමික වතාවත්වල යෙදෙමින්

# සපුමල්ගස්කඩ රජමහා විහාර දාගැබේ ධාතු තැන්පත් කෙරේ

■ මාධව කුලසූරිය - වවුනියාව

වවුනියාව, බෝගස්වැව, ඓතිහාසික සපුමල්ගස්කඩ රජමහා විහාරයේ ප්‍රතිසංස්කරණය කරන ලද දගැබේ ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම පෙරේද (03 වැනිද) සිදු කෙරිණි. එම විහාරයේ විහාරාධිපති, උතුරු පළාත් ප්‍රධාන සංඝනායක ගල්ගමුවේ සන්තබෝධි නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර රුවන්වැලි මහා සෑය අසල සිට දින හතරක කාලයක් භික්ෂූන් වහන්සේලා 80 නමක් පාගමනින් ධාතූන් වහන්සේලා රැගෙන ඒමෙන් අනතුරුව දගැබේ ධාතු තැන්පත් කිරීමේ පුණ්‍ය කර්මය පැවැත්විණි.

මුලතිව්, කුරුන්දි දගැබ ඉදිකිරීමේදී මතුවූ ගැටලු මෙන්ම සපුමල්ගස්කඩ රජමහා විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලදීද විවිධ බාධා සිදුවූ බව ප්‍රදේශවාසීහු පවසති. මෙම අවස්ථාවට රාජ්‍ය ඇමැති අනුප පස්කුවල්, පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් වීරසේකර, බෞද්ධ මහා සම්මේලනයේ හිටපු සභාපති ජගත් සුමතිපාල, නැගෙනහිර පළාත් හිටපු ආණ්ඩුකාර අනුරාධා යහම්පත්, වවුනියාව දිස්ත්‍රික් ලේකම් පී. ඒ. සරත්චන්ද්‍ර ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

# ජනපති කතරගම ආගමික වතාවත්වල



ජනාධිපති රනිල් වික්‍රමසිංහ පෙරේදා (03 වැනිදා) ඓතිහාසික කතරගම පුද බිම වෙත ගොස් ආගමික වතාවත්වල නිරත විය. කිරිවෙහෙර විහාරාධිපති ශාස්ත්‍රවේදී කොබවක ධම්මින්ද නායක හිමිපාණන් වහන්සේ බැහැ දුටු ජනාධිපතිවරයා උන්වහන්සේගේ සුවදුක් විමසමින් කෙටි පිළිසඳරකද නිරත විය.

කතරගම වාර්ෂික ඇසළ මහා පෙරහර මංගල්‍යයේ අවසන් දිනය වූ පෙරේදා පෙරහර ආරම්භ කරමින් කණ්ඩුල හස්ති රාජයා මත සධාතුක කරඬුව තැන්පත් කිරීමද ජනාධිපතිවරයා අතින් සිදු කෙරිණි. අනතුරුව අවසන් මහා පෙරහර නැරඹීමට එක් වූ ජනාධිපතිවරයා කතරගම සමන් මහා දේවාලය වෙතද ගොස් ආශිර්වාද ලබා ගත්තේය.



# වැස්ස වැඩිවී ඉඟුරු වගාවල රෝග පැතිරේ

■ නිර්මාණි තිලකසිරි

මේ දිනවල පවතින වැසි තත්ත්වයේ වැඩිවීමත් සමග ඉඟුරු වගාබිම් ආශ්‍රිතව රෝග පැතිර යෑමේ අවදානමක් පවතින බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය සඳහන් කරයි. රැල්ස්ටෝනියා සොලනේසියාරුම් නමැති බැක්ටීරියාව මගින් ව්‍යාප්ත වන බැක්ටීරියා මැලවීමේ රෝගය මේ දිනවල බහුලව දක්නට ලැබෙන බවත් මෙම රෝගයට අමතරව මෘදු කුණුවීමේ රෝගය හෙවත් රෛසෝම කුණුවීමේ රෝගය සහ පත්‍ර ලප රෝගයද පැතිරයෑමේ හැකියාවක් පවතින බවත් මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ ශාක ව්‍යාධි විද්‍යා අංශයේ පර්යේෂණ සංවර්ධන සහකාර රුචිරා කොඩිතුවක්කු පැවැසුවාය.

බැක්ටීරියා මැලවීමේ රෝගය වගාව තුළ ව්‍යාප්ත වූ පසු පාලනය කිරීම තරමක් අපහසු වන අතර මෙම රෝගය මගින් ඉඟුරු අස්වැන්නට දැඩි බලපෑමක් එල්ල වේ. රෝගය වැළඳීමෙන් පසුව ඉඟුරු ශාකයේ කඳ කඩාවැටීම සිදුවන අතර පත්‍ර දර හැකිළීම, ශාකයේ පසෙන් ඉහළ කොටසේ තෙත පැල්ලම් දක්නට ලැබීම මෙහි ප්‍රධාන රෝග ලක්ෂණ ලෙස දැකිය හැකිය. මෙම රෝගය උග්‍ර වූ අවස්ථාවේදී ශාකය තද කහපැහැ වීම සිදුවේ.

මේ වනවිටත් මෙම රෝගය දිවයින පුරා දක්නට ලැබෙන රෝගයක් වුවත් පවතින වැසි තත්ත්වයත් සමග මේ පිළිබඳ සැලකිලිමත් නොවුණහොත් මෙය වසංගත මට්ටමක් දක්වා පැතිර යා හැකි බැවින් රෝගය හඳුනාගත් මූලික අවස්ථාවේදීම ආසාදිත පැළ ගලවා ඉවත් කිරීම, හොඳින් වගාබිම තුළ ජලය බැස යෑමට සැලැස්වීම මෙන්ම නිලධාරීන්ගේ උපදෙස් මත බෝඩෝ මිශ්‍රණය රෝග පැතිර ඇති වගා බිම් තුළට යෙදීම සිදුකළ යුතු බව ඇය වැඩිදුරටත් සඳහන් කළාය.

# වෙඩි වැදුණු අග්බෝට අසාධ්‍යයි

■ සාලිය කුමාර ගුණසේකර

අනුරාධපුර, තිරප්පනේ ප්‍රදේශයේ නිතර සැරිසැරූ "අග්බෝ" නමැති දළ ඇතාට බඳින තුවක්කුවකින් වෙඩි වැදීම නිසා ඉතා අසාධ්‍ය තත්ත්වයෙන් පසුවන බව වනජීවී නිලධාරීහු කියා සිටිති. අවුරුදු 40ක් පමණ වයසැති මෙම ඇතා අඩි 10ක් පමණ උසැතිය. විශාල දළ යුගලක් සහිත මෙම ඇතාගේ එක් දළයක් අඩි 05ක් පමණ දිගැතිය. මෙම ඇතාට මීට පෙරදීද වෙඩි වැදීම නිසා සිරුර පුරා වෙඩි උණ්ඩ දක්නට ලැබෙන බව වනජීවී නිලධාරීහු පවසති.

බඳින තුවක්කුවක උණ්ඩයක් ඇතාගේ ඉදිරි පාදයකට වැදීම නිසා ඇතා ඇවිදීමේ අපහසු තත්ත්වයෙන් තිරප්පනේ සංචාරක හෝටලයක් පිටුපස වැවක සිටී. අසාධ්‍ය තත්ත්වයෙන් පසුවන අග්බෝ ඇතාට අනුරාධපුර, පණ්ඩුලගම වනජීවී පශු වෛද්‍ය කාර්යාලයයේ නිලධාරීහු දැනට මාසයක පමණ කාලයක සිට ප්‍රතිකාර කරති.

වනජීවී නිලධාරීන් පෙරේද (03 වැනිද) දිනයේදී ඇතාට ප්‍රතිකාර කිරීම සඳහා ගිය අවස්ථාවේදී සංචාරක හෝටලයේ සිටි ජර්මන් ජාතික සංචාරක කාන්තාවක් වනජීවී නිලධාරීන්ද නංවාගෙන ඇතා සිටින ස්ථානයට ඔරුව හබල් ගසමින් ගියාය. ඇය වනජීවී නිලධාරීන්ට පවසා ඇත්තේ තමාට ඔරු පැදීමේ හැකියාව පවතින බැවින් ඇතාට ප්‍රතිකාර කිරීමේ කටයුතුවලට සහයෝගය දක්වන බවය. ඇතාට දිගින් දිගටම ප්‍රතිකාර කරනු ලැබුවද, ඇතාට පාදය නවා ඇවිදීමේ අපහසුතාව පවතින බව වනජීවී නිලධාරීහු සඳහන් කරති.

# මහ රෑ නිවෙස්වලට හොඬය දමා හැළි වළන් ඇද කෑම සොයන අලියෙක්



හානියට පත් කළ කෙසෙල් වගාවක්

■ බණ්ඩාර මුදියන්සේ - පොලොන්නරුව

පොලොන්නරුව, ගල්ලැල්ල, කුසුම්ගම ප්‍රදේශයේ නිවෙස්වල හැළි වළන් ඇද කෑම සොයා සැරිසරන වන අලියකු නිසා ගම්වාසීන් දැඩි පීඩාවකට පත්ව ඇත. සෑම දිනකම රාත්‍රි කාලයේ ගම් වදින මෙම වන අලියා නිවෙස්වලට හොඬය දමා ආහාර හා ධාන්‍ය කා දමන බව ඔවුහු පවසති.

"මගේ නිවස සම්පූර්ණයෙන් හදලා ඉවර නෑ. කාමර දෙකක් හදගත්තේ. රොටී අනං මනං හදලා කඩවල්වලට දලා තමයි එදිනෙද ජීවිතය ගැට ගහගන්නේ. ඊයේ පාන්දර අලියා ඇවිත් කාමරේ ජනේලෙන් හොඬය දැම්මා. ටික වෙලාවකින් ගල් ගැලවී ගැලවී වැටෙන්න ගත්තා. ඔළුව දැම්මා ගේ ඇතුළටම. ඔළුව හරව හරව හැම තැනම කන්න දේවල් හෙව්වා. පාන්දර කඩේට දන්න රොටී හදන්න අනලා තිබුණු පිටි එක වළඳකින් වහලා තිබුණේ. ඒක ඇරලා පිටි ටික ගිල්ලා" යැයි කුසුම්ගම පදිංචි ආර්. ජී. දේවිකා නදීශානී පැවැසුවාය.

මේ වනවිට එම ප්‍රදේශයේ නිවෙස් කිහිපයකටම හානි සිදුකර ඇති බවත් මේ හේතුවෙන් ගම්බිම් අතහැර යෑමට පවා සිදුව ඇති බවත් ගම්මු මැසිවිලි නගති. ගත වූ දින දෙකේ පමණක් මෙම අලියා කුසුම්ගම සුබෝධි රාජාරාම විහාරස්ථානයේ ගේට්ටුවද කඩා දමා විහාරස්ථානයේ වගාවන් රැසකටද හානි කර තිබේ.



වළඳක් ගුරා කෑම කා ඇති අයුරු





DLB සංවර්ධන ලොතරැයි මණ්ඩලය www.dlb.lk
2023.07.03 වන සඳුදා
නිල ප්‍රතිඵල

අද කෝටිපති ADA KOTIPATHI
දිනය 2023.07.03 | දිනුම් වාරය 1964 | වර්ණය රතු
ජයග්‍රාහී අංක 33 34 44 77 | ඉංග්‍රීසි අක්ෂරය W
මීළඟ සුපිරි ජයමල්ල රු. 54,907,857.80

කප්රුක
දිනය 2023.07.03 | දිනුම් වාරය 1314 | වර්ණය කොළ
ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක
A 12 16 50 75 76
මීළඟ සුපිරි ජයමල්ල රු. 342,803,009.80

ලග්න වාසනාව
දිනය 2023.07.03 | දිනුම් වාරය 3850 | වර්ණය කහ
ජයග්‍රාහී අංක 01 26 42 58 | මිථුන
මීළඟ සුපිරි ජයමල්ල රු. 2,665,256.20

ජයෝදා Jayoda
දිනය 2023.07.03 | දිනුම් වාරය 1935 | වර්ණය තැඹිලි
ජයග්‍රාහී අංක 06 12 43 57 | ඉංග්‍රීසි අක්ෂරය D
මීළඟ සුපිරි ජයමල්ල රු. 44,549,231.60


ශනිදා Shanida
දිනය 2023.07.03 | දිනුම් වාරය 4299 | වර්ණය ලා නිල්
ජයග්‍රාහී අංක 02 11 59 65 | ඉංග්‍රීසි අක්ෂරය L
මීළඟ සුපිරි ජයමල්ල රු. 30,000,00.00


SUPER BALL
දිනය 2023.07.03 | දිනුම් වාරය 2138 | වර්ණය දම්
ජයග්‍රාහී අංක 01 17 45 75 | ඉංග්‍රීසි අක්ෂරය X
මීළඟ සුපිරි ජයමල්ල රු. 53,163,772.40

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ.
මේ වන විට සුපිරි ජයමල්ල දිනාගෙන ඇත්නම් එදිනට පවතින ජයමල්ල වලංගු වේ.




# බතික් සැරසිලි මැවූ හසරැලි


අයිෂා-දෙබෝරා


හරිනි- හසිනි


ටානියා


ජලනි - චමින්ද්‍රානි


සහන්-ඇලන්-කාර්තිනි


සාරාව්-සායිඩ්


සාරා ඩින් ස්මයිල්





ජලනි-සංගීතා


සොහාර්නි


ඉනෝචි-ජෙසිකා


කේටි


මෙලිනා


සාරා-නිජාත්

Fusion 14 හි "Step Into Our Process" උත්සවය වන් ගෝල්ෆේස්හිදී පසුගිය ජුනි 30 සිට ජූලි 2 දක්වා පැවැත්විණි. එහිදී අඩි 90ක් දිගැති අඩි 12ක් පළල ලංකාවේ මෙතෙක් නිර්මාණය කළ දිගම බතික් රෙද්ද ප්‍රදර්ශනයට එක් කර තිබුණි.

බතික් නිර්මාණ ශිල්පිනියක් වන සාරා ඩින් ස්මයිල් විසින් මෙම බතික් රෙද්ද නිර්මාණය කර ඇති අතර ඒ සඳහා නිජාත් ඩීන් ස්මයිල්, අයේෂා සීකර්, ඩෙබෝරා ඇන්ජලි ඇතුළු ශිල්පීන් කණ්ඩායමක් සම්බන්ධ වී තිබේ. එමෙන්ම මෙම උත්සවයේදී තවත් බතික් නිර්මාණ රැසක් ප්‍රදර්ශනය කර තිබූ අතර ඒවා මිලදී ගැනීම සඳහාද විශාල පිරිසක් පැමිණ සිටියහ. විශේෂයෙන් ඒවා මිලදී ගැනීමට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසගේ බිරිඳ ජලනි ප්‍රේමදාස, චිත්‍රපට නිළි සංගීතා වීරරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ලගේ දියණිය චමින්ද්‍රානි කිරිඇල්ල ඇතුළු ආරාධිතයින් රැසක් එක්ව සිටියහ.

ඡායාරූප - සමන් අබේසිරිවර්ධන


කතයුෂා




නිලක්ෂි


ක්වේම්-රාසා



ටිසේරා


නටාලියා


ලුලු-එමී


බර්නි




ලකීනා-ඩැනියෙල්


නදීකා-අමිල

# දකුණු කොරියාවේ ස්ථාන 400ක් ළමයින්ට තහනම්



දරුවන් රැගෙන ආ නොහැකි බවට අවන්හලක සඳහන් කර ඇති අයුරු

එතෙර අරුණ

රුක්ලන්ති පෙරේරා

දකුණු කොරියාවේ ළමයින්ට තහනම් කලාප සීග්‍රයෙන් ඉහළ දමමින් තිබේ. ලොව අඩුම උපත් අනුපාතයක් සහිත රටක් ලෙස සැලකෙන දකුණු කොරියාව තුළ වැඩි දරුවන් සංඛ්‍යාවක් පවුල්වලට එකතු කරගැනීමට රජයෙන් දිරිගැන්වීම් කරන අතරවාරයේ එය පරස්පර විරෝධී සිදුවීමකි. වැඩිහිටියන්ට කරදර බාධාවලින් තොර නිදහස් පරිසරයක් ලබාදීමේ අරමුණින් ස්ථාපනය කොට තිබෙන මෙබඳු ළමා තහනම් කලාප මෑතභාගයේදී කෙතරම් ජනප්‍රියව තිබේද යත් රට පුරා එවැනි පෙදෙස් හාරසියයකට අධික සංඛ්‍යාවක් දැනට ක්‍රියාත්මක වෙමින් තිබේ. නමුත් ලොව අඩුම උපත් අනුපාතයකට අමතරව වඩාත් වේගයෙන් වියපත්වන ජනගහණයක් සහිත රටක් ලෙස දකුණු කොරියාව මුහුණ දී සිටින අර්බුදය හමුවේ ළමයින්ට මෙබඳු තහංචි පැනවීම කෙතරම් දුරට ප්‍රායෝගිකද යන්නට දැන් දැන් තර්ක විතර්ක ගොඩනැගෙමින් තිබේ.

## උපත් අනුපාතය ජපානයටත් වඩා පහළට

වඩාත් වේගයෙන් වියපත් වන ජනගහණය නිසා දකුණු කොරියාවේ බඳු අයකර ගත හැකි වැඩකරන ජනතාවගේ ප්‍රතිශතය අඩුවෙමින් ඇත. ඒ නිසා දිනෙන් දින වැඩිවන වැඩිහිටි ජනගහණයට විශ්‍රාම වැටුප් හා සෞඛ්‍ය සේවා සපයාදීම දකුණු කොරියාව හමුවේ ඇති දැවැන්ත අර්බුදයක් බවට පත්ව තිබේ. පසුගිය වසරේදී එරට උපත් අනුපාතය වාර්තාගත 0.78ක අවමයකට පහළ බැස තිබිණි.

එය ස්ථාවර ජනගහණයක් පවත්වාගෙන යෑමට අවශ්‍ය 2.1ක උපත් අනුපාතයෙන් භාගයකටත් වඩා අඩුය. එය දැනට ලොව වඩාත්ම වේගයෙන් වියපත් වන ජනගහණයක් සහිත රට වන ජපානයේ උපත් අනුපාතයටත් වඩා පහළ අගයක් ගැනීම විශේෂයෙන් කැපී පෙණිනි.

වැඩ කළ යුතු සති දිගුවීම, දිනෙන් දින ඉහළ යන ඉඩකඩම් මිල හා ආර්ථික ගැටලු හමුවේ අඩපණව සිටින තරුණ දකුණු කොරියානු ප්‍රජාවට මෙවැනි ළමා තහනම් කලාපවල නැගී සිටීම දරු පවුලක් නඩත්තු කිරීම දෙවරක් නොව කිහිප වරක්ම සිතා බැලිය යුතු විශාල අභියෝගයක් බවට පත්කොට ඇත.

ඉකුත් දහසය වසර තුළදී තරුණ ප්‍රජාව වැඩි වැඩියෙන් දරුවන් හදවඩා ගැනීමට යොමු කිරීම සඳහා ඇමරිකානු ඩොලර් බිලියන දෙසීයකට අධික මුදලක් දකුණු කොරියානු රජය වැයකොට තිබේ. නමුත් විද්වතුන් පෙන්වා දෙන්නේ ළමයින් සම්බන්ධයෙන් දකුණු කොරියානු සමාජය තුළ මුල්බැස ගත් ආකල්ප වෙනස් කිරීම සඳහා රජය ඊට වඩා වැඩි අවධානයක් දිය යුතු බවයි.


දරුවා රැගෙන ආ මන්ත්‍රීවරිය

## විරෝධය පාන්න මන්ත්‍රීවරියක් පුතා පාර්ලිමේන්තුවට රැගෙන ඇවිත්

ළමා තහනම් කලාපවලට එරෙහි එබඳු ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා පසුගිය සතියේදී සිදුවූ එක්තරා සිදුවීමකින්ද යම් පමණකට දායකත්වයක් ලැබී තිබිණි. ඒ මන්ත්‍රීවරියක වන යොන්-හයි-ඉන් ජාතික මන්ත්‍රණ සභාවේ (පාර්ලිමේන්තුවේ) සැසි වාරයක් සඳහා ළමා දිනය නියෝජනය කරමින් සිය දෙහැවිරිදි කුඩා පුතුව රැගෙන ඒමය. ළමයින්ට තහනම් කලාපයක් වූ ජාතික මන්ත්‍රණ සභාවට එලෙස සිය පුතුව ගෙනඑමින් ඇය කියා සිටියේ ළමයින්ට තැනක් ලබාදෙන නව සමාජයක් ලෙස වත්මන් දකුණු කොරියානු සමාජය පුනරුත්පත්තියක් ලැබිය යුතු බවයි.

ඇගේ එම ප්‍රකාශයට ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ විශාල අවධානයක් හිමිව තිබිණි. ඒ අතර සංචාරකයන් අතර අතිශයින් ප්‍රකට ජෙජු දිවයිනේ නගර සභාව ළමා තහනම් කලාපවලට එරෙහි පනතක් විවාදයට ලක්කළේ එවැනි පනතක් දකුණු කොරියාවට ප්‍රථම වරට හඳුන්වා දෙමිනි.


දරුවන් රැගෙන යා හැකි උපකරණ නරඹන පියෙක්


දරුවා රැගෙන රැකියා ස්ථානයට පැමිණි මවක්

සංචාරකයන් අතර අතිශය ප්‍රකට නැරඹුම් ස්ථානයක් වන ජෙජු දිවයිනේ වන අවන්හල් හා සංචාරක ලැගුම්හල් එබඳු ළමා විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ඔවුන්ගේ සත්කාරකබව සම්බන්ධයෙන් හිමිව ඇති ගෞරවයට කැළලක් ඇති කරන බවට නගරසභා බලධාරීන් තුළ හටගත් සාධාරණ බිය, එබඳු පණතක් හඳුන්වා දීමට ප්‍රධානම හේතුවක් විය. නමුත් විද්වතුන් පෙන්වා දෙන්නේ එලෙස ළමුන් වර්ජනය කිරීම හුදෙක් ව්‍යාපාරික අවස්ථා අහිමි කිරීමකට වඩා ගැඹුරකට ගිය, දකුණු කොරියානු ව්‍යවස්ථාව පවා උල්ලංඝනය කරන අයුක්ති සහගත ක්‍රියාවක් බවයි. 2017 වසරේදී ළමා තහනම් කලාප සමානාත්මතාව පිළිබඳ අයිතීන් උල්ලංඝනය කරන බව පවසමින් එවැනි ළමා තහනම් කලාප අත්හිටුවන ලෙසට දකුණු කොරියානු ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිසම නිල ප්‍රකාශයක් පවා නිකුත් කළේ, එවැනි පියවරක් ගත් පළමු රාජ්‍ය ආයතනය බවට පත්වෙමිනි.

ඒ ජෙජු දිවයිනේ අවන්හලක් තමාව පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසාවෙන් කෝපයට පත් තිදරු පියෙකු ගොනු කළ පෙත්සමක ප්‍රතිඵලයක් ලෙසය. කෙසේ වුවද දකුණු කොරියාව පුරා ක්‍රියාත්මක වන ළමා තහනම් කලාප මුලුමනින්ම ඉවත් කිරීමට තරම් මෙබඳු නියෝග සමත්ව නැත.

## ළමා තහනම් කලාපවල ආරම්භය

දකුණු කොරියාවේ ක්‍රියාත්මක වන මෙබඳු ළමා තහනම් කලාපවල ආරම්භය 2012 වසරේ දී එරට අවන්හලක සිදුවූ එක්තරා සිදුවීමක් අරඹයා වූවක් බවට පිළිගැනීමය. අවන්හලකට පැමිණි පුද්ගලයෙකු අතින් අත්වැරදීමකින් සුප් බඳුනක් හැලී දරුවෙකු පිළිස්සීමේ සිද්ධියක් කේන්ද්‍ර කරගනිමින් ඇරඹුණු ළමා තහනම් කලාප මේ වනවිට දකුණු කොරියාව තුළ කෙතරම් ජනප්‍රියද යත්, සෑම වැඩිහිටියන් දසදෙනෙකුගෙන් හත්දෙනෙකුම ඒවාට අනුබල දෙන බව ජනමත විමසුම්වලින් අනාවරණය වී තිබේ.

කෙසේ වුවද මින් බරපතළ ලෙසම පීඩාවට පත්ව සිටින්නේ දරුවන් සිටින මව්වරු බවට සැකයක් නැත. මෙම අර්බුදය ඛේදවාචකයක් දක්වා ඔඩුදුවා ඇති බව ඔප්පු වූයේ පසුගිය දිනක රැකියාවේ නියුතු එක්තරා මවක් සියදිවි හානිකර ගැනීමේ සිද්ධියක් නිසාය. සියදිවි නසා ගැනීමට පෙර ඇය ලියා තැබූ සටහනෙන් ඇය විමසා තිබුණේ දරුවන් සිටින මවක රැකියාවේ නිරත වීම පවක්ද කියාය.

කෙසේ වුවද මෙම අර්බුදය දෙස මධ්‍යස්ථව බැලුම් හෙළන විද්වතුන් පෙන්වා දෙන්නේ ව්‍යාපාරික ස්ථානවල ළමා තහනම් කලාප වෙනුවට ළමුන්ට තහනම් වූ වේලා කලාප හඳුන්වාදීම වඩාත් ප්‍රායෝගික වනු ඇති බවය.

# නංගීගේ පෙට්ටියේ ගැටයට අනංගයා අහුවෙලා




හෙෂාර සෙනාල් සෝමරත්න - අනුරාධපුරය

ඔහු ප්‍රදේශයේ තරමක් ජනප්‍රිය හා ප්‍රසිද්ධත්වයක් උසුලන පුද්ගලයෙකි. මේ නිසාම ඔහු තරමක් ආඩම්බරයෙන් පසුවිය. යන යන තැන ඔහුගේ ජනප්‍රියත්වයට ඇදී එන සුන්දර යුවතියෝද බොහෝය. එවන් යුවතියන් දුටු විගස ඔහුගේ බැල්ම යොමු වන්නේ ඔවුන්ගේ කකුල් දෙසටය. කෙල්ලෙක් ඇඟෑලුම්කමක් පෑ විට ඔහු ලවා ඕනෑම දෙයක් කර ගැනීමට පවා හැකිය. දිනක් ඔහුට කදිම පාඩමක් ඉගැන්වීමට තරුණියක් කටයුතු කළාය.

දිනක් මේ පුද්ගලයා සිය හදිසි අවශ්‍යතාවක් සඳහා දුර බැහැර ගමනක් යෑමට බස් රථයට ගොඩවීම සඳහා නගරයේ බස් නැවතුම අසලට වී සිටියේය. මේ අතර හදිසියෙන් වගේ යම් පෙට්ටියක් ද අතැතිව පැමිණි තරුණියක් ඔහු ළඟටම ඇවිත් ඔහුගේ නම කියා අහවල් අයියා නේද? මං ඔයා ගැන අහලා තියෙනවා. ඔයා හරි හොඳයි ආදී චාටු බස් දෙඩමින් මෙම තරුණිය ඔහුට ඇඟෑලුම්කම් පා තිබිණි. පසුව ඔහුව තම වසඟයට ගැනීමට ඇය සමත් වූවාය. ඔහු ඇඹරෙමින් ඇය කියන දේවල්වලට පිළිතුරු ලබා දෙමින් සිටියේය. දැන් ඇය සමග ඇතිවූ මිතුදම වඩාත් දැඩිවූ නිසා ඔහු ඇයගෙන් මෙසේ විමසා තිබිණි.

"නංගී මොකක්ද ඔය අතේ තියෙන පෙට්ටිය..? "යැයි විමසූ විට ඇය "අනේ අයියේ මේ මගේ යාළුවෙක්ගේ බර්ත්ඩේ එකකට යන්න යන්නේ අයියේ. මං මේ අයියා එක්ක කතා කරන ගමනුත් මේ මගේ යාළුවෙක් එනවා කිව්වා එයා එනවද බල බල තමා හිටියේ. අනේ අයියේ තරහා නැතුව මේ පෙට්ටිය චුට්ටක් අල්ල ගන්න බැරි ද? එයා මේ ටිකක් දුර ඉඳන් එන හින්ද ඉන්න තැන හොයා ගන්න බැරුව ඇත්තේ. මං එයාව එක්කන් එන්නම් ටක්ගාලා. මේකත් උස්සන් ටවුන් එකට යන්න බෑ අයියේ. කියා කීවාය.

ඇය එය කියා නිම කිරීමටත් පෙර අපේ මිත්‍රයා ඇය අත වූ පෙට්ටිය බලෙන්ම මෙන් ඉල්ලා ගත්තේ අයියෝ නංගී ඕක මොකක් ද ඔයා ගිහින් එන්න පැයක් නෙවේ පැය දෙකක් වුණත්, මං මේක ඔයා එනකන් ඔයා වෙනුවෙන්ම තියන් ඉන්නම්කෝ යැයි කීවේ පැණි හිනාවක් ද දමමිනි.

තරුණිය අඩියට දෙකට සෙනග අතුරින් බස් නැවතුමෙන් දුරස් වී ගිය අතර ඇය විනාඩි පහෙන් එන බව කී නිසා පෙට්ටිය අතැති පුද්ගලයාද ඇය ඉක්මනින් පැමිණේ යැයි සිතමින් ඇය එන මග බලමින් කල්පනා ලොවක අතරමං වී සිටියේය. විනාඩිය, දෙක, විනාඩි පහ, දහය, පැය බාගය, පැය ගණන් ගත වී ගිය ද ඇය එන පාටක් නොවීය. නන්නාඳුනන තරුණියක් නිසා ඇය කොහේ ගියා දැයි විමසීමටවත් නොහැකි විය. හදිසියට ඇයගේ දුරකථන අංකය ඉල්ලා ගන්නට ද අමතක වී තිබිණි. දැන් කරන්නට දෙයක් නැත.

කුම්බලාවෝ කෑවා නම් විඳවපන් බළලෝ යැයි සිතින් සිතමින් තමාට වූ ඇබැද්දිය කල්පනා කරමින් සිටියේය. යන්නට ආ කාරණය ඉටු කර ගැනීමටත් කාලය මදිය. දැන් රෑ බෝ වීටත් ආසන්නය. පැය අටකට ආසන්න කාලයක් ඔහු බස් නැවතුමේය. තම නිවෙසට යන අවසාන බසයත් දැන් යන්නට ආසන්නය. ඇය නොඑවී යයි සිතා වෙන දෙයක් වුණාවේ කියා ඇය ගෙනා පාර්සලයේ තිබෙන්නේ මොනාවාදැයි බලන්නට උඩු කෙළවරින් පාර්සලය විවෘත කළේය.

පාර්සලය විවෘත කරත්ම එහි තිබී යම් ලොකු අකුරුවලින් සටහන් වූ කොළයක් බිමට වැටිණි. තෑග්ග පසෙකලා ඒ කොළය ගෙන ඔහු කියවන්නට විය. එහි මෙසේ සඳහන්ව තිබිණි.

"අයියේ ආයේ මේ වගේ මෝඩකම් කරන්න එපා'' යැයි එහි සඳහන්ව තිබිණි.

